

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

# වාර්ෂික වාර්තාව
# 2020

BOI
SRI LANKA

# වාර්ෂික වාර්තාව
# 2020

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

# පටුන


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | 5 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 6 |
| දැක්ම, මෙහෙවර හා වටිනාකම් | 10 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සැකැස්ම | 13 |
| සුවිශේෂී සිදුවීම් | 14 |
| 2020 වසරේ විශේෂ අවස්ථා | 16 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පිළිබඳ සංක්ෂිප්ත සටහනක් | 17 |
| 2020 වසරේ ගෝලීය ආයෝජන ප්‍රවණතාව | 19 |
| අභියෝගාත්මක ගෝලීය ආයෝජන ප්‍රවණතාව මධ්‍යයේ 2020 වසරේ ශ්‍රී ලංකාවේ ආයෝජන කාර්යසාධනය | 20 |
| මෑතකාලීන ආරම්භයන් | 23 |
| **COVID-19** සමග ඉදිරි කටයුතු සැලසුම් කිරීම | 27 |
| අපගේ කාර්ය මණ්ඩලය | 30 |
| ආයතනික සමාජ වගකීම | 34 |
| 2020 වසරේ මූල්‍ය සමාලෝචනය | 35 |
| 2020 වසරේ විගණකාධිපතිවරයාගේ වාර්තාව | 71 |
| 2020 වසරේ විගණකාධිපතිවරයාගේ වාර්තාව සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පිළිතුරු | 85 |
| විගණන කමිටු වාර්තාව | 94 |
| ආයතනික ව්‍යුහය | 95 |
| 2020.12.31 දිනට ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් | 96 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්යාල නාමාවලිය | 97 |

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



2020 වසර සමස්ත ලෝකයටම අනපේක්ෂිත වසරක් විය. සාමාන්‍ය ජන ජීවිතය මෙන්ම ව්‍යාපාර ද බිඳවැටිණ. හදිසියේ ඇති වූ මෙම ව්‍යසනයට මුහුණදීමට ක්‍රමවේදයක් සැකසී නොතිබුණි. මෙවන් අභියෝග හමුවේ වුව ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අවස්ථා ගණනාවකදී විශිෂ්ට ප්‍රතිඵල අත්කර ගනු ලැබීය. රජයේ "2025 වසරේ දැක්ම" ළඟාකර ගැනීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රගතිශීලී ආරම්භයන්ගෙන් කීපයක් පිළිබඳව මම මෙහිදී සඳහන් කිරීමට අපේක්ෂා කරමි.

ආයෝජන මණ්ඩලය සහ එහි නිලධාරීන් 2020 වසරේදී ද රජයේ "2025 වසරේ දැක්ම" ළඟාකර ගැනීම සඳහා වෙහෙස නොබලා කටයුතු කරන අතර ම ආයෝජන ප්‍රජාව සඳහා ද ඉමහත් කැපවීමෙන් අඛණ්ඩව සිය සේවාව සලසනු ලැබීය. දිගටම රට වසාදමා තිබුණ ද මෙහෙයුම් කටයුතු පවත්වා ගැනීම සඳහා අප විසින් සේවාලාභී ව්‍යවසායයන්ට නිරන්තර සහය ලබාදුන් නිසා 2020 වසරේ මැයි මාසය වනවිට ඉක්මණින්ම ජාතික අපනයනය සාමාන්‍ය මට්ටමට ළඟාකර ගැනීමට හැකියාව ලැබිණ. එමගින් දේශීය ආයෝජකයින් අතර විශ්වාසය වර්ධනය වූ අතර ආයෝජන සඳහා වඩාත් සුදුසු ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ යෝග්‍යතාවය කැපී පෙණින.

සමාලෝචනයට ලක්වන වසර තුළ, "වර්ධනයේ දශකය" ලෙස නම් කරන ලද ඉදිරි වසර දහයක කාලය තුළ රටේ ආර්ථික අපේක්ෂාවන්ගේ ස්ථාවර පදනමක් ඇතිකිරීම අරමුණුකර ශ්‍රී ලංකාවේ ඍජු විදේශ ආයෝජන උපායමාර්ග සකස් කිරීම සඳහා ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සිය අවධානය යොමුකර ඇත. මෙම සැලසුම අනුතිව ශ්‍රී ලංකාව සඳහා හොඳින් නිර්වචනය කරන ලද ඍජු විදේශ ආයෝජන උපායමාර්ග සමගින් අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ දක්වා ඇති පරිදි ආයෝජන සඳහා ප්‍රමුඛ ක්ෂේත්‍ර නිර්ණය කිරීමටත්, රටේ ආර්ථික පසුබිම උපායමාර්ගික වෙනසකට ලක්කිරීමටත් අපට හැකිවී තිබේ. 2021 වසරේ වාර්ෂික අයවැය හරහා ආයෝජකයින් සඳහා විශේෂිත බදු දිරිගැන්වීම් ලබාදීම මගින් උපායමාර්ගයන්ට සහය දක්වන ලෙස ශ්‍රී ලංකා රජයට ඉල්ලීම් කරනු ලැබීය. රජය විසින් සරල බදු ව්‍යුහයක් සහ හිතකර ආයෝජන වාතාවරණයක් සහතික කිරීම මගින් මේ සඳහා සහය දක්වනු ලැබීය. සමාජ දේශපාලනික ස්ථායිතාවය මගින් ශක්තිමත් වූ හිතකර වෙළඳ වාතාවරණය ඒ සඳහා ඉවහල්වන නෛතික හා නියාමන රාමුව මගින් තවදුරටත් ශක්තිමත්වනු ඇති අතර ආයෝජන මූල්‍ය හා ශ්‍රමය යන කරුණු හා අදාල නීති සඳහා ප්‍රගතිශීලී වෙනස්කම් ඇතිකිරීම සඳහා ස්ථාවර සැලසුම් සකස් කෙරෙමින් පවති.

ඖෂධ හා රෙදිපිළි කර්මාන්තය අරමුණුකරගෙන හම්බන්තොට හා එරාවූර් ප්‍රදේශයේ නව අපනයන සැකසුම් කලාප ස්ථාපනය කිරීමේ ක්‍රියාවලියේ ද ශීඝ්‍ර ප්‍රගතියක් අත්කරගෙන ඇත. එමගින් නිසැකයෙන් ම දේශීය අගය එකතු කිරීමේ ධාරිතාව සඳහා අපේක්ෂිත අභිවෘද්ධිය ලබාදෙනු ඇත.

රටතුළට ඍජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැලසීම සඳහා ස්ථාපිත ප්‍රධාන ආයතනය ලෙස, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නිරන්තරයෙන් ම රටේ ආයෝජන වාතාවරණය වැඩිදියුණු කිරීමට මෙන්ම රටට ප්‍රතිලාභ අත්කරදීම සඳහා ආර්ථික ප්‍රමුඛතාවන්ට සහයදීම වෙනුවෙන් ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීමට කැපවී සිටී. ආයෝජක ප්‍රජාවට, පාර්ශවකාර ආයතන සහ රාජ්‍ය ආයතනවලට මෙන්ම ආයෝජන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට 2020 වසරේදී ලබාදුන් සහය වෙනුවෙන් කෘතඥතාවය පළකිරීමට මම මෙය අවස්ථාවක් කරගනිමි.

2021 වසර බෙහෙවින් බලාපොරොත්තු සහිත වසරකි. ඔබගේ සහයෝගය සහ අපගේ සාමූහික ප්‍රයත්නය සමගින් අපගේ දැක්ම යථාර්ථයක් කරගැනීමට හැකිවන අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ඉදිරි ගමන තවදුරටත් සාර්ථක කරගැනීමට හැකිවනු ඇති බව මාගේ විශ්වාසයයි.

# අධ්‍යක්ෂ මණ්ඩලය



සුසන්ත රත්නායක මහතා
සභාපති



ජනාධිපති නීතිඥ
ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



සංජේ කුලතුංග මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ආචාර්ය හර්ෂ සුභසිංහ මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ජයමින් පැල්පොල මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

# අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පිළිබඳව

## 01 සුසන්ත රත්නායක

ව්‍යාපාර අංශයේ වසර 40 වැඩි පළපුරුද්දක් සහිත සුසන්ත රත්නායක මහතා 2019 වසරේ දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත්වූ අතර ඔහු විවිධ කර්මාන්ත 13ක් හරහා ව්‍යාප්තව ඇති විවිධ ආයතන 9ක අධ්‍යක්ෂ මණ්ඩල 46ක සාමාජිකත්වය දරමින් කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට එක්වීමට පෙර රත්නායක මහතා, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් පීඑල්සී, ලංකා වාණිජ මණ්ඩලය, ලංකා තේ මණ්ඩලය, ලංකා සේවායෝජකයින්ගේ සම්මේලනය සහ ලංකා දුම්කොළ සමාගම පීඑල්සී ඇතුළු කීර්තිමත් ප්‍රමුඛ ආයතන ගණනාවක සභාපතිවරයා ලෙස කටයුතු කර ඇත. 2013 වසරේදී ලංකා දුම්කොළ සමාගමට එක්වීමට පෙර, 1978 වසරේදී ශ්‍රී ලංකාවේ විශාලම වෙළඳපළ ප්‍රාග්ධනීකරණ ව්‍යාපාරික (Blue Chip) ප්‍රමුඛයෙකු වන ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් ආයතනයට එක්වූ රත්නායක මහතා 2006 වසරේදී එම සමාගම් සමූහයේ සභාපතිවරයා බවට පත්ව අඛණ්ඩව කටයුතු කරනු ලැබීය. එම සභාපති ධූරයන්ට අමතරව, රත්නායක මහතා 2019 වසරේ සිට ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් සමාගමේ (2011-2015) සහ වෝටර්ස් එජ්හි (2011) අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද ආර්ථික සංවර්ධන ජාතික කවුන්සිලය (NCED) යටතේවන සංචාරක ශ්‍රේණිගත කිරීමේ හා ආයෝජන ප්‍රවර්ධන කමිටුවල (2008 වසරේ සිට) සාමාජිකයෙකු සහ රාජ්‍ය ව්‍යාපාර, ව්‍යවස්ථාපිත ආයතන සහ රජයට අයත් වාණිජ ව්‍යාපාරවල අධ්‍යක්ෂ මණ්ඩල සඳහා සුදුසු පුද්ගලයින් පත්කිරීම පිළිබඳ නිර්දේශ ලබාදීම සඳහා ජනාධිපතිවරයා විසින් පත්කරන ලද වෘත්තීයවේදීන්ගෙන් සමන්විත සය සාමාජික කමිටුවේ සාමාජිකයෙකු ලෙස ද රජයේ හා රජයට අනුබද්ධ ආයතනයන්හි විවිධ තනතුරු හොබවා ඇත. රත්නායක මහතා මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ සහ කොළඹ රාජකීය විද්‍යාලයේ ආදි සිසුවෙකු ද වෙයි.

## 02 ජනාධිපති නීතිඥ හර්ෂ කබ්රාල්

ජනාධිපති නීතිඥ, ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා සමාගම් නීතිය, බුද්ධිමය දේපළ නීතිය, වාණිජ නීතිය, සුරකුම්පත් නීතිය, ජාත්‍යන්තර වෙළඳ නීතිය හා වාණිජ විනිශ්චය යන ක්ෂේත්‍රයන්හි වසර තිස් තුනක (33) පළපුරුද්දක් සහිත ජනාධිපති නීතිඥයෙකි. වසර දාසයක් (16) ජනාධිපති නීතිඥයෙකු ලෙස කටයුතු කරනු ලැබූ ඔහු ශ්‍රී ලංකාවේ වාණිජ මහාධිකරණයේ හා උපරිමාධිකරණයේ සුවිශාල මෙහෙයක් ඉටුකරනු ලැබේ. ඔහු ඔස්ට්‍රේලියාවේ කැන්බරා විශ්වවිද්‍යාලයෙන් සංස්ථාපිත නීතිය පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා ඇත.

ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ (ICC) පැරීසියේ ජාත්‍යන්තර බේරුම් කිරීමේ උසාවියේ සාමාජිකයෙකු වන ආචාර්ය කබ්රාල් මහතා ඒකාබද්ධ ගැටුම් කළමනාකරණ සම්මේලනයේ (FICM) සහ ජාත්‍යන්තර වාණිජ ආරවුල් විනිශ්චය සභාවේ (ICDT) නියෝජිත සාමාජිකයෙකු ද වේ. එසේම ඔහු එක්සත් රාජධානියේ වරලත් ලේකම්වරුන්ගේ හා පරිපාලකයින්ගේ ආයතනයේ ද සාමාජිකත්වය දරයි.

## 03 සංජේ කුලතුංග

සංජේ කුලතුංග මහතා චිකාගෝ විශ්වවිද්‍යාලයේ Booth School of Business වෙතින් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ලබාගෙන ඇති අතර වරලත් මූල්‍යමය විශ්ලේෂක සංගමය (CFA) මගින් මූල්‍ය හා ආයෝජන වෘත්තිකයින් සඳහා පිරිනමන වෘත්තීය පිළිගැනීම ද (CFA Charterholder) ලබා ඇත.

Jardine Fleming Hong Kong සමාගමෙහි කලාපීය විශ්ලේෂකයෙකු ලෙස කටයුතු කරනු ලැබූ කුලතුංග මහතා දැනුම් ක්‍රියාවලි බාහිරින් සපයා ගැනීමේ සමාගමක් වන Amba Research Lanka සමාගමේ ආරම්භක අධ්‍යක්ෂවරයා වේ. නිෂ්පාදන, විවේක හා මූල්‍ය ක්ෂේත්‍රයන් ඇතුළු තෝරාගත් කර්මාන්තයන්හි ප්‍රධාන විධායක නිලධාරි, විධායක අධ්‍යක්ෂ හා ප්‍රාරම්භක යන තනතුරු හොබවා ඇත.

කුලතුංග මහතා ශ්‍රී ලංකාවේ වරලත් මූල්‍ය විශ්ලේෂක සංගමයේ (CFA) සභාපතිවරයා ලෙස ද කටයුතු කර ඇති අතර ශ්‍රී ලංකා විනිමය හා සුරකුම්පත් කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු ලෙස මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය අංශයේ ස්ථායිතාවය පිළිබඳ උපදේශන කමිටුවේ ද කටයුතු කර ඇත.

## 04 හර්ෂ සුබසිංහ

ආචාර්ය හර්ෂ සුබසිංහ මහතා ශ්‍රී ලංකාව, එක්සත් රාජධානිය හා ඇ.එ.ජ මූලික කරගත් කෝඩ්ජෙන් සමාගම් සමූහයේ ප්‍රාරම්භක, සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී වේ. මෙම සමාගම සංචාරක, අධ්‍යාපන, මෝටර් රථ, ප්‍රවාහන, කෘෂිකාර්මාන්තය, බලශක්තිය හා සෞඛ්‍යය සේවා යන බහුවිධ කර්මාන්ත සඳහා නවෝත්පාදන, සම්පූර්ණයෙන්ම ප්‍රවේශ විය හැකි, ඉහළ කාර්යසාධනයකින් යුත් විසඳුම් ලබාදීම සඳහා ප්‍රසිද්ධියක් උසුලයි. TravelBox Vega, chargeNET, AiGROW, Cloud Smart School සන්නාමයන් සමගින් කෝඩ්ජෙන් සමාගම ශ්‍රී ලංකාවේ කෘතිම බුද්ධිය සම්බන්ධ පෞද්ගලික අංශයේ විශාලම ආයෝජකයින්ගෙන් එකක් වේ. ආචාර්ය සුබසිංහ මහතා කෝඩ්ජෙන් සමාගමේ අති නවීන නිෂ්පාදන සැලසුම් හා විසඳුම් සමගින් බොහෝ වාරයක් ඉතා ආඩම්බරයෙන් ශ්‍රී ලංකාව ලෝකයේ වෙනත් රටවල් අතරට ගෙන එනු ලැබ තිබේ.

විශ්වවිද්‍යාල සමග කටයුතු කරමින් ශ්‍රී ලංකාවේ නවෝත්පාදන සංස්කෘතියක් දිරිමත් කිරීම සඳහා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකරන ආචාර්ය සුබසිංහ මහතා, ඉහල IP වටිනාකමක් ලබාදෙන Real-world projects ව්‍යාපෘති සඳහා පහසුකම් සලසන අතරම අනාගත පරම්පරාව කර්මාන්ත සඳහා සූදානම් තත්වයට හැඩගැස්වීමේ එකම අරමුණ ඇති වූ QBITS Labs ආරම්භය යටතේ රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් සඳහා ප්‍රධාන අනුග්‍රාහක ආයතනයක් වේ. මොරටුව විශ්වවිද්‍යාලයේ QBITS Labs මගින් එහි සිසුන්ට වසර 3ක වැඩකිරීමේ ආචාර්ය උපාධියක් ලබාදේ.

ට්‍රේස් එක්ස්පර්ට් සිටි (Trace Expert City) සමාගමේ ප්‍රධාන නිර්මාතෘවරයෙකු වන ආචාර්ය සුබසිංහ මහතා එහි උපසභාපතිවරයා ද වේ. මෙම සමාගම, පරිසර හිතකාමී පරිසරයක් සහ ශ්‍රී ලංකාව තුළ අතිවිශේෂ නිෂ්පාදන නිපදවීම සඳහා නවෝත්පාදන අංශයේ අතිදක්ෂ කාර්ය බලකායකින් සමන්විත ලොව ඉහළ තත්වයේ කාර්ය පරිශ්‍ර ගොඩනැගීම සඳහා ශ්‍රී ලංකා නාගරික සංවර්ධන අධිකාරිය සමග දිගුකාලීන ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබීය.

එක්සත් රාජධානියෙන් විදුලි, ඉලෙක්ට්‍රොනික සහ පරිගණක ඉංජිනේරු උපාධිය ලබා ඇති අචාර්ය සුබසිංහ මහතාගේ ශාස්ත්‍රීය අධ්‍යයනයන්ට තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිය මෙන්ම කෘතිම බුද්ධිය හා මෘදුකාංග පිළිබඳ ආචාර්ය උපාධි පර්යේෂණයක් ඇතුළත් වේ.

## 05 ජයමින් පැල්පොල

ජයමින් පැල්පොල මහතාට Goldman Sachs (UK) සහ Nomura USA ආයතනවල පළපුරුද්ද ඇතුළුව ජාත්‍යන්තර ආයෝජන බැංකුකරණය හා වත්කම් කළමනාකරණයේ වසර 10කට වැඩි පළපුරුද්දක් ඇත. ඔහු වෝල් ස්ට්‍රීට්හි සිය නිර්මාණාත්මක හා වඩාත්ම ලාභදායි ආයෝජන උපායමාර්ග සඳහා පිළිගැනීමක් ඇති සමාගමක් වන Goldman Sachsys හි ප්‍රධාන උපායමාර්ගික කණ්ඩායමේ සේවයේ නියුතුව ඇති එකම ශ්‍රී ලාංකිකයා වේ. පැල්පොල මහතා සිය වෘත්තියේ දී විවිධ අංශයන් හා විවිධ රටවල ඇ.ඩො.බිලියන 20 වැඩි වටිනාකමකින් යුත් ජාත්‍යන්තර ආයෝජන ව්‍යුහගත කිරීම හා කළමනාකරණය කිරීම සිදුකර ඇත.

ජ්‍යෙෂ්ඨ උපදේශකයෙකු වශයෙන් පැල්පොල මහතා බැංකු අංශයේ ප්‍රතිසංවිධානය කිරීම පිළිබඳව එක්සත් ජනපදයේ බැංකු හා ජාත්‍යන්තර මහ බැංකු සඳහා උපදෙස් ලබාදී ඇත. විශේෂයෙන්ම ඔහු නියාමකයින්ට මෙන්ම ඇමරිකානු බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට, DBS, Wells Fargo හා Deutsche Bank සඳහා ප්‍රාග්ධන ප්‍රමාණවත් බව පිළිබඳ තීරණ, ප්‍රාග්ධනීකරණය සහ බැංකුකරණයේදී ඩිජිටල් නවෝත්පාදන යෙදවීම සම්බන්ධයෙන් උපදෙස් ලබාදෙනු ලැබීය.

මූල්‍ය අංශයේ සිය පළපුරුද්ද ගොඩනගාගත් පැල්පොල මහතා ආයෝජකයෙකු හා ව්‍යවසායකයෙකු ලෙස fintech සමාගමට එක්විය. සම්ප්‍රදායික නොවන වත්කම් මිල කිරීම සඳහා වෙළඳ නාමයක් යටතේ ලියාපදංචි කරන ලද ආකෘතියක් වැඩිදියුණු කිරීම සහ එය Wall Street බැංකුවට විකිණීම මගින් ඔහු සිය ව්‍යවසායකත්ව ගමන් මග ඇරඹීය.

පැල්පොල මහතා, මූල්‍ය අංශය සඳහා තාක්ෂණය හා දත්ත විද්‍යාව අදාලකර ගැනීමේ කාර්යය වෙනුවෙන් ආසියාවේ හොඳම fintech ආරම්භක සමාගම් වලින් එකක් ලෙස හඳුනාගනු ලැබූ Moneyworkz Technologies සමාගමේ ආරම්භක සභාපතිවරයා ද වේ.

වර්තමානයේ ඔහු ජයරු ට්‍රේඩ් පාර්ට්නර්ස් (Jayaru Trade Partners) සමාගමේ සභාපතිවරයා හා සිලෝන් එකෝ ස්පයිසස් (Ceylon Eco Spices) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරයි. සිලෝන් එකෝ ස්පයිසස් සමාගම ජාත්‍යන්තර වෙළඳපල 10කට වැඩි සංඛ්‍යාවක් සඳහා කල්තබාගත හැකි කෘෂිකාර්මික වෙළඳ භාණ්ඩ අපනයනය කරන ප්‍රධාන ශ්‍රී ලංකීය අපනයන සමාගමකි.

හාවඩ් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇති පැල්පොල මහතා CFA Institute (USA) සහ CIMA (UK) වෙතින් මූල්‍ය හා ආයෝජන වෘත්තිකයින් සඳහා පිරිනමන වෘත්තීය පිළිගැනීම ද ලබාගෙන ඇත. වයස අවුරුදු 20 දී ලොව ලාබාලම CIMA කළමනාකරණ ගණකාධිකාරීවරයා වූ ඔහු එවර ලාබාලම CIMA ත්‍යාගලාභියා ද විය. CIM (UK) වෙතින් ඔහු සිය අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ඇත.

# අපගේ දැක්ම

"ආසියාවේ තිරසාර ආයෝජන සඳහා
වඩාත්ම ආකර්ෂණීය ගමනාන්තය බවට
ශ්‍රී ලංකාව පත්කිරීම"






# අපගේ මෙහෙවර

"ශ්‍රී ලංකාවට ගුණාත්මක ආයෝජන ආකර්ෂණය කරගැනීමේ හා රැඳවාගැනීමේ විභවතාවය ඉටුකිරීම සඳහා, වැඩිදියුණු කළ අපනයන පදනමක් ලබාදීමට මූලික වෙමින් සහ වඩා හොඳ රැකියා අවස්ථා ඇතිකිරීමටත් නව තාක්ෂණය හා නවෝත්පාදන තුළින් දැනුම හා නිපුණතා වැඩිදියුණු කිරීමටත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ධනාත්මකව හා වේගවත් ලෙස කටයුතු කරනු ලැබේ"

# වටිනාකම්

## කාර්යසාධනය සහ ඉලක්ක ළඟාකරගැනීමේ අභිලාෂය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, තාත්වික ආයෝජන සහ රැකියා අවස්ථා බිහි කිරීමේ ඉලක්ක සමගින් සිය අභිලාෂයන් සාක්ෂාත් කරගැනීමට ක්‍රියා කරනු ඇත.

## රාජ්‍ය හා පෞද්ගලික අංශ අතර සම්බන්ධතාවය ගොඩනැගීම

රටෙහි ආර්ථික සෞභාග්‍යය සඳහා ඉවහල්වන ආයෝජන සඳහා පහසුකම් සැලසීම, සුරක්ෂිතතාවය සහ වර්ධනය කිරීමේ අභිමානවත් කාර්යය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඉටු කරනු ලැබේ. අපගේ මෙහෙවර ඉටුකිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේ ම ආයතන සමග සහයෝගීතාවයෙන් හා හවුල්කාරීත්වයෙන් කටයුතු කරන අතර ඔවුන්ගේ අරමුණු සාක්ෂාත් කරගැනීමට ද දායක වන්නෙමු.

## වෘත්තීය දැනුම සහ අඛණ්ඩතාව

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ආයෝජකයින්ගේ අවශ්‍යතාවන් හඳුනා ගැනීමට කැපවනු ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී වාණිජ හා නව්‍ය විසඳුම් ලබාදෙනු ලැබේ. අප විසින් අඛණ්ඩව, විශ්වාසනීයත්වයෙන් මේ සඳහා හෘදයාංගමව කැප වී සිටින්නෙමු.

## උසස් පාරිභෝගික සේවාව

ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම සඳහා තරඟ කිරීමේදී ක්‍රියාකාරී මෙන්ම සුවිශේෂී මට්ටමෙන් කටයුතු කිරීම.

## කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, විශිෂ්ටත්වය සඳහා සිය කාර්ය මණ්ඩලයේ දක්ෂතාවය, සහයෝගීතාවය, කැපවීම හා වගකීම අගය කරනු ඇත. කාර්ය මණ්ඩලයට සේවයේ නිරත වීම, අභිවෘද්ධිය සහ සාර්ථකත්වය ළඟාකර ගැනීම සඳහා වන සුවිශේෂී ස්ථානයක් බවට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පත්කිරීම කෙරෙහි අප නිරන්තර අවධානය යොමු කරන්නෙමු.

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සැකැස්ම

1978 දී සංස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ආයෝජකයින්ට ව්‍යාපාර සඳහා පහසුකම් සලසමින් ආයෝජන ප්‍රවර්ධනය, කර්මාන්ත සංවර්ධනය හා සහය සේවාවන් සඳහා පහසු ප්‍රවේශ සලසන කේන්ද්‍රස්ථානයක් ලෙස කටයුතු කිරීමේ විධිවිධාන සමගින් ආයෝජන ප්‍රවර්ධනය සඳහා වන ජාතික ආයතනය ලෙස කටයුතු කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සිදු කිරීමේ ප්‍රධාන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, පුහුණු හා ආංශික රැකියා අවස්ථා බිහිකිරීම, අපනයන උත්පාදනය හා රටේ ආයෝජන වාතාවරණය වැඩිදියුණු කිරීම මගින් සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගනිමින් තිරසාර ආර්ථික වර්ධනයක් සඳහා දායක වේ.

## අරමුණ

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අරමුණ වන්නේ ජාතික ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, විදේශ ආයෝජන සඳහා මග සැළසීම සහ ඵලදායී ආයෝජන වාතාවරණයක් ඇතිකිරීම මගින් රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම වේ. එමගින් අපනයන ආදායම් බිහිකරමින් සහ ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ආයෝජන ගමනාන්තයක් බවට පත්කිරීමේ අභිප්‍රායෙන් තිරසාර විදේශ ආයෝජන ළඟාකර ගැනීම සඳහා මහත් පරිශ්‍රමයක් දරනු ලැබේ.

## පරමාර්ථ

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මූලික පරමාර්ථ තුළින් ආර්ථික සංවර්ධනය ඇතිකිරීම සහ වැඩිදියුණු කිරීම, ආර්ථිකයේ පදනම පුළුල් කිරීම හා ශක්තිමත් කිරීම, සෘජු විදේශ ආයෝජන දිරිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම, විදේශ විනිමය ඉපයීමේ ප්‍රභව විවිධාංගිකරණය කිරීම හා අපනයන ආදායම ඉහළ නැංවීම, ශ්‍රී ලංකාව තුළ කර්මාන්ත හා ව්‍යවසායයන් ස්ථාපනය කිරීම හා සංවර්ධනය කිරීම, දිරිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

## කාර්යභාරය

- රජයේ ආයෝජන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දක්වමින් සෘජු විදේශ ආයෝජන මට්ටම ක්‍රමිකව ඉහළ නැංවීම සහ ජාතික වර්ධන ඉලක්ක සපුරාගැනීම සඳහා දායකත්වයක් ලබාදෙමින් ආර්ථිකයේ ප්‍රමුඛතම අංශ සඳහා ආයෝජන ඉලක්ක කිරීම හා ආයෝජන ආකර්ෂණය කරගැනීම.
- ශ්‍රී ලංකාවේ ඉහළ අගයක් එක්කළ/උසස් තාක්ෂණික නිෂ්පාදන, ඉහළ අගයක් එක්කළ ඇඟළුම්, තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා, සංචාරක කර්මාන්තය, ආහාර පිරිසැකසුම් කිරීම, සැපයුම් සේවා, අධ්‍යාපන හා මහා පරිමාණ යටිතල පහසුකම් හෝ වෙනත් තෝරාගත් අංශවල ව්‍යාපෘති සැලසුම් කිරීමේ අභිප්‍රායෙන් යුත් ආයෝජකයන් සමඟ සම්බන්ධ වීමේ පළමු ස්ථානය වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු කරයි. ආයෝජකයින්ට පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය තොරතුරු හා මාර්ගෝපදේශන ලබාදෙන අතර වෙනත් රේඛීය ආයතනවල අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වන අවස්ථාවලදී එම ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු ද සිදුකරයි.
- ආයෝජන සහන අනුමත කිරීම හා අවසර ලබාදීම සහ අදාළ අංශවල ආයෝජන අයදුම්පත් ඇගයුම් කිරීම මෙන්ම මෙම ව්‍යාපෘතිවල විදේශික ශ්‍රමිකයන්ට වීසා නිකුත් කිරීම ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් සිදු කරයි.
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ප්‍රාග්ධන භාණ්ඩ හා අමුද්‍රව්‍ය ආනයනය මෙන්ම නිමි භාණ්ඩ අපනයනය සඳහා ද ආනයන/අපනයන නිශ්කාෂණ ලබා ගැනීම සහ පහසුකම් සැලසීම මගින් ව්‍යාපෘති ආරම්භයේ සිට ක්‍රියාත්මක කිරීම සහ සාර්ථකව මෙහෙයුම් කිරීම දක්වා වන සම්පූර්ණ ව්‍යාපෘති චක්‍රය පුරා ආයෝජකයන්ට සහාය ලබාදේ.
- අවම කාලයක් තුළ ආයෝජකයින්ට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු පරිශ්‍ර සැපයීම සඳහා ආයෝජන මණ්ඩලය මගින් අවශ්‍ය යටිතල පහසුකම් සහිතව අපනයන සැකසුම් කලාප සංවර්ධනය කෙරේ.

# සුවිශේෂී සිදුවීම්

## 1978

1978 අංක 04 දරණ පාර්ලිමේන්තු පනත යටතේ මහ කොළඹ ආර්ථික කොමිසම (GCEC) ස්ථාපනය කිරීම.

## 1979

ශ්‍රී ලංකාවේ ප්‍රථම හා මේ දක්වා පවත්වාගෙන යන විශාල ම අපනයන සැකසුම් කලාපය වන කටුනායක අපනයන සැකසුම් කලාපය 1979දී ස්ථාපනය කිරීම.

## 1986

අපනයන සැකසුම් කලාපයන්හි ව්‍යවසායයන්ට සහය දීම සඳහා මහ කොළඹ ආර්ථික කොමිසම මගින් රැකියා බැංකුව ඇති කිරීම.
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ දෙවන අපනයන සැකසුම් කලාපය ලෙස 1986දී බියගම අපනයන සැකසුම් කලාපය ස්ථාපනය කිරීම.

## 1990

විදේශ ආයෝජන උපදේශන කමිටුව හා මහ කොළඹ ආර්ථික කොමිසම එකට එක් වූ අතර ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජන අනුමත කිරීමේ පූර්ණ අධිකාරිය මහ කොළඹ ආර්ථික කොමිසමට හිමිවිය.

## 1991

දකුණු පළාත සංවර්ධනය කිරීම සඳහා කොග්ගල අපනයන සැකසුම් කලාපය පිහිටුවීම.

## 1992

1992 අංක 49 දරන පනත යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) සංස්ථාපනය කරනු ලැබූ අතර එය මහ කොළඹ ආර්ථික කොමිසමේ (GCEC) අනුප්‍රාප්තිකයා වේ.
විරැකියාව අවම කිරීම සඳහා රජයේ කලාපීය සංවර්ධන වැඩසටහන යටතේ "ඇඟළුම් කම්හල් 200 වැඩසටහන" හඳුන්වා දෙනු ලැබීය.

## 1995

මහනුවර කාර්මික උද්‍යානය පිහිටුවීම.

## 1998

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා ආයෝජන යටිතල පහසුකම් කාර්යාංශය (BII) ඒකාබද්ධ කරනු ලැබීය.
මීරිගම අපනයන සැකසුම් කලාපය හා මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානය පිහිටුවීම.

## 1999

හොරණ අපනයන සැකසුම් කලාපය හා වතුපිටිවල අපනයන සැකසුම් කලාපය පිහිටුවීම.

## 2000

පොල්ගහවෙල, මාවතගම හා මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාප පිහිටුවීම.

## 2001

සීතාවක කාර්මික උද්‍යානය, සීතාවක අපනයන සැකසුම් කලාපය ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පවරා ගැනීම.

## 2006

කර්මාන්ත ග්‍රාමීය අංශය වෙත ගෙනයාමේ අරමුණ ඇතිව "ව්‍යවසායයන් 300 වැඩසටහන" ආරම්භ කරනු ලැබීය.

## 2008

ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ මහල් 09ක් මිලදී ගෙන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ස්ථිර ලෙස ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ ස්ථාපනය කිරීම.

## 2009

ISO 9001:2000 ලබාගත් ප්‍රථම රාජ්‍ය ආයතනය වූයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයයි.
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ යාපනය කාර්යාලය පිහිටුවනු ලැබීය.

## 2011

ඇ.ඩො. බිලියන 1ක සෘජු විදේශ ආයෝජන ඉලක්කය ළඟාකර ගනු ලැබීය.

## 2013

2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය නායකයින්ගේ සමුළුවට (CHOGM) සමගාමීව පැවති "පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යාපාරික සංසදය" සංවිධානය කිරීමේ මූලිකත්වය ගනු ලැබූයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයයි.

## 2014

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් - "ආසියා ශාන්තිකර ව්‍යාපාරික සංසදය 2014" සඳහා අනුග්‍රාහකත්වය ලබාදෙනු ලැබීය.

## 2017

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 40 වන සංවත්සරය සැමරීම.

## 2018

ඇ.ඩො. බිලියන 2.37ක ඉහළ ම සෘජු විදේශ ආයෝජනයක් ළඟාකර ගනු ලැබීය.

## 2019

බිංගිරිය අපනයන සැකසුම් කලාපය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අපනයන සැකසුම් කලාප සඳහා අළුතින් එක්විය.

## 2020

එරාවුර් හා ආරබොක්ක (හම්බන්තොට) නව අපනයන සැකසුම් කලාප 2 සංවර්ධනය කිරීම ආරම්භ කරනු ලැබීය.

# 2020 වසරේ විශේෂ අවස්ථා

ඇ.ඩො. බිලියන 2.3ක වටිනාකමකින් යුත් ආයෝජන ව්‍යාපෘති 144 ක් සඳහා අනුමැතිය ලබාදෙන ලදී. (නව ව්‍යාපෘති 26ක් සහ පුද්ගල ආරක්ෂක උපකරණ (PPE) නිපදවීම සඳහා වන ව්‍යාපෘති 52ක පුළුල් කිරීම් ඇතුළුව ව්‍යාපෘති පුළුල් කිරීම් 118 සඳහා)

CHEC වරාය නගරයේ කොළඹ ජාත්‍යන්තර මූල්‍ය ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො. **මිලියන 1,000ක** ආයෝජනය අනුමත කරන ලදී.

මහා පරිමාණ ටයර් නිෂ්පාදන ව්‍යාපෘතියක් සඳහා ඇ.ඩො. **මිලියන 300ක** ආයෝජන ගිවිසුමක් අත්සන් කරන ලදී.

වසංගත තත්ත්වය හමුවේ වුව ද රටතුළට ඇ.ඩො. **මිලියන 687ක** සෘජු විදේශ ආයෝජන හා ඇ.ඩො. **මිලියන 716ක** දේශීය ආයෝජන ආකර්ෂණය කරගැනීමට හැකිවිය.

ඇ.ඩො. බිලියන 7ක වෙළඳ භාණ්ඩ හා සේවා අපනයනයන්

(ජාතික අපනයනයෙන් 66% හා ජාතික කාර්මික අපනනයනයෙන් 85%)

ඖෂධ හා රෙදිපිළි නිෂ්පාදනය සඳහා විශේෂිත අපනයන සැකසුම් කලාප 2ක් (EPZs) සංවර්ධනය කෙරෙමින් පවතී.

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පිළිබඳ සංක්ෂිප්ත සටහනක්

## රටතුලට සෘජු විදේශ ආයෝජන ගලනයන් (ඇ.ඩො.මිලියන)




**1978 – 2020 දක්වා කාලසීමාවේදී රටතුළට සමස්ත සෘජු විදේශ ආයෝජන ගලනය ඇ.ඩො. බිලියන 19**

*හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෘප් (ප්‍රයිවට්) ලිමිටඩ් මගින් 2017 දී ලැබූ ඇ.ඩො. මිලියන 292.1 සහ 2018 දී ලැබූ ඇ.ඩො. මිලියන 827.6 වටිනාකමකින් යුත් සෘජු විදේශ ආයෝජන ද ඇතුළත්ය.

## ආර්ථික බලපෑම



ජාතික අපනයනයෙන්
66%

ජාතික කාර්මික අපනයනයෙන්
85%

ජාතික ඇඟළුම් හා රෙදිපිළි අපනයනයෙන්
97%

සම්පූර්ණ ශ්‍රම බලකායෙන්
6%

**> 1,600**
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ මෙහෙයුම් සිදුකරන සමාගම්

**> 500,000**
සමුච්චිත සෘජු රැකියා උත්පාදනය

*ඇ.ඩො. බිලියන 19*
*1978 - 2020 දක්වා වන කාලසීමාවේදී රටතුළට සෘජු විදේශ ආයෝජන ගලනය*

*ඇ.ඩො. බිලියන 7-8*
*වාර්ෂික වෙළඳ භාණ්ඩ හා සේවා අපනයනයන්*

*මෙහෙයුම් කටයුතුවල නිරත අපනයන සැකසුම් කලාප*
*13*

*සංවර්ධනය කරමින් පවතින (බිංගිරිය අ.සැ.ක.)*
*1*

*විශේෂයෙන් ඖෂධ හා රෙදිපිළි නිෂ්පාදනය සඳහා අළුතින් ඉදිකරෙන අපනයන සැකසුම් කලාප*
*2*

*මූලාශය; ආයෝජන මණ්ඩලය හා ශ්‍රී ලංකා මහ බැංකුව*

## සෘජු විදේශ ආයෝජනයන්හි ආංශික ව්‍යාප්තිය

## සෘජු විදේශ ආයෝජන කරන ලද ප්‍රමුඛ රටවල් 10

**2011 - 2020 අතර කාලයේදී රටතුලට ඇ.ඩො. බිලියන 13ක සෘජු විදේශ ආයෝජන ගලා එනු ලැබීය**







## අපනයන සැකසුම් කලාප (EPZs)




*මෙහෙයුම්හි නිරත අ.සැ.ක 13 + සංවර්ධනය කරමින් පවතින අ.සැ.ක 1 (බිංගිරිය අ.සැ.ක)*

*මෙහෙයුම් සිදුකරන සමාගම් > 265*
*රැකියා උත්පාදනය > 130,000*
*වාර්ෂික අපනයන ආදායම >ඇ.ඩො.බිලියන 3*

*විශේෂයෙන්ම ඖෂධ හා රෙදිපිළි නිෂ්පාදනය සඳහා අළුතින් ඇතිකරන ලද අ.සැ.ක 2 (හම්බන්තොට හා එරාවූර් අ.සැ.ක)*

# 2020 වසරේ ගෝලීය ආයෝජන ප්‍රවණතාව

2019 වසරේදී නව කොරෝනා වෛරසයේ ව්‍යාප්තියත් සමග 2020 මාර්තු මාසය වනවිට ගෝලීය වසංගතයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම නිසා ආසන්න ඉදිරි වසරවල ගෝලීය සෘජු විදේශ ආයෝජනය සීඝ්‍ර පසුබෑමකට ලක්වනු ඇති බවට කළින්ම අපේක්ෂා කළ හැකිවිය. විවාදයට ලක්ව ඇති පරිදිම, 2020 වසරේදී 42%ක දැඩි පසුබෑමකට ලක්වූ ගෝලීය සෘජු විදේශ ආයෝජනය, 2019 වසරේ දී ඇ.ඩො. ට්‍රිලියන 1.5 සිට ඇ.ඩො. බිලියන 859ක ඇස්තමේන්තුගත අගයක් දක්වා පහත වැටිණ. මෙය 2009 වසරේ දී ගෝලීය මූල්‍ය අර්බුදය සමග ඇති වූ ආයෝජන පසුබෑමට වඩා 30%ක අඩුවීමකි.

සංවර්ධනය වන රටවල් ඇ.ඩො. බිලියන 616ක ඇස්තමේන්තුගත අගයක් සහිතව 12%ක සාපේක්ෂ පසුබෑමක් පමණක් අත්විඳිනු ලැබූ අතර සංවර්ධිත රටවල් කෙරෙහි ඇ.ඩො. බිලියන 229ක ඇස්තමේන්තුගත අගයක් දක්වා 69%ක සීඝ්‍රතම අඩුවීමක් කේන්ද්‍රගත විය. සංවර්ධනය වන ආසියානු රටවල් 4%ක අවම සෘජු විදේශ ආයෝජන අඩුවීමක් අත්විඳි අතර ලතින් ඇමරිකානු රටවල් කරා සෘජු විදේශ ආයෝජනය මූලික වශයෙන් 37%කින් පහළයාමක් සමග වෙනත් සංවර්ධනය වන කලාපයන්හි සෘජු විදේශ ආයෝජනය අඩුවීමේ විෂමතාවක් ඇතිවිය. යුරෝපය කරාවූ සෘජු විදේශ ආයෝජනය සෘණ අගයක් (ඇ.ඩො.බිලියන 4) දක්වා තුනෙන් දෙකකින් අඩු වූ අතර එක්සත් රාජධානිය සඳහා වූ සෘජු විදේශ ආයෝජනය ශුන්‍ය අගයක් ගත් අතර එක්සත් ජනපදය වෙත ආයෝජන ගලනය 50%කින් අඩුවිය.

Covid-19 වසංගතය සියලුම ආකාරයේ ආයෝජන කෙරෙහි බලපෑම් ඇතිකරනු ලැබීය. අනුබද්ධ සමාගම් ස්ථාපනය කිරීමේ ආයෝජන ව්‍යාපෘති (Greenfield Investment Project) දැනුම්දීම් (35%කින් අඩුවිය), විදේශීය සමාගම් හා දේශීය සමාගම් අතර (Cross-border M&As) ආයෝජන (10%කින් අඩුවිය) හා නව ජාත්‍යන්තර ව්‍යාපෘති මූල්‍යයන කටයුතු (2%කින් අඩුවිය).

**කලාපීය වශයෙන් සෘජු විදේශ ආයෝජන රටතුළට ගලා ඒම, 2019 හා 2020 වසර**




මූලාශ්‍රය: UNCTAD ආයෝජන ප්‍රවණතා අධීක්ෂණ, 2021 ජනවාරි 24 දිනැති 38වන නිකුතුව

කෙසේවුවද, ගෝලීය සෘජු විදේශ ආයෝජනයන්ගෙන් 72%ක් ආරක්ෂාකර ගැනීමට සංවර්ධිත රටවලට හැකි වූ අතර වසංගතයේ මුල් අදියරේ දී ප්‍රාග්ධන වියදම්වල ඇති වූ පසුබෑම නොසළකා චීනය එරටට ඇ.ඩො.බිලියන 163ක් සෘජු විදේශ ආයෝජන ආකර්ෂණයකර ගනිමින් විශාල ම සෘජු විදේශ ආයෝජනලාභියා බවට පත්විය. ඒ අතර ගෝලීය සෘජු විදේශ ආයෝජනයන්ගෙන් තුනෙන් එකක් ආකර්ෂණය කරගනු ලැබූ නැගෙනහිර ආසියාව වැඩිම ගෝලීය සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගත් කලාපය වූ අතර ඩිජිටල් අංශයේ ආයෝජන වැඩිවීමත් සමග ඉන්දියාව සෘජු විදේශ ආයෝජනයන්හි 13%ක වැඩිවීමක් අත්දකිනු ලැබීය. නමුත් අග්නිදිග ආසියාතික රටවල් වෙත සෘජු විදේශ ආයෝජන 31%කින් අඩු වූ අතර දකුණු ආසියාතික රටවල් වෙත සෘජු විදේශ ආයෝජන 10%කින් වැඩිවිය.

# 2020 වසරේ ශ්‍රී ලංකාවේ ආයෝජන කාර්යසාධනය
## අභියෝගාත්මක ගෝලීය ආයෝජන ප්‍රවණතාවය මධ්‍යයේ

### 2020 වසරේ ව්‍යාපෘති කාර්යසාධනය

ඇස්තමේන්තුගත ආයෝජනය (ඇ.ඩො.මිලි)

| | ආකාරය | ව්‍යාපෘති සංඛ්‍යාව | විදේශීය | දේශීය | එකතුව |
|---|---|---|---|---|---|
| අනුමත ව්‍යාපෘති | නව ව්‍යාපෘති | 26 | 1,462 | 64 | 2,302 |
| | ව්‍යාපෘති පුළුල් කිරීම් | 118 | 192 | 584 | |
| ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති | නව ව්‍යාපෘති | 29 | 650 | 557 | 1,660 |
| | ව්‍යාපෘති පුළුල් කිරීම් | 93 | 91 | 555 | |
| ක්‍රියාත්මක ව්‍යාපෘති | නව ව්‍යාපෘති | 28 | 51 | 241 | 783 |
| | ව්‍යාපෘති පුළුල් කිරීම් | 49 | 82 | 409 | |
| වාණිජ මෙහෙයුම් ආරම්භ කරන ලද ව්‍යාපෘති | නව ව්‍යාපෘති | 13 | 13 | 180 | 536 |
| | ව්‍යාපෘති පුළුල් කිරීම් | 39 | 131 | 212 | |

*සටහන: 2021 මාර්තු මාසය වනවිට ව්‍යාපෘති අවලංගු කිරීම් හැර*

### අනුමත ව්‍යාපෘතිවල 2020 වර්ෂයේ ප්‍රගතිය

| අනුමත | ගිවිසුම් අත්සන් කරන ලද | ක්‍රියාත්මක | වාණිජ මෙහෙයුම් ආරම්භකරන ලද |
|---|---|---|---|
| **ඇ.ඩො.මිලි 2,302** (නව ව්‍යාපෘති 26ක් හා ව්‍යාපෘති පුළුල් කිරීම් 118ක්) | **ඇ.ඩො.මිලි 1,027** (නව ව්‍යාපෘති 15ක් හා ව්‍යාපෘති පුළුල් කිරීම් 78ක්) | **ඇ.ඩො.මිලි 433** (නව ව්‍යාපෘති 8ක් හා ව්‍යාපෘති පුළුල් කිරීම් 26ක්) | **ඇ.ඩො.මිලි 100** (නව ව්‍යාපෘති 1ක් හා ව්‍යාපෘති පුළුල් කිරීම් 18ක්) |

*සටහන: 2021 මාර්තු මාසයට ප්‍රගතිය*

### 2020 වසරේදී සෘජු විදේශ ආයෝජන ගලනය

ඇ.ඩො. මිලියන 687ක් ලෙස වාර්තාවන වන 2020 වසරේදී ශ්‍රී ලංකාවට ලැබුණු මුළු සෘජු විදේශ ආයෝජනයෙන් වැඩිම සෘජු විදේශ ආයෝජනය (37%) දේපළ සංවර්ධන අංශය සඳහා ලැබී ඇති අතර පිළිවෙලින් නිෂ්පාදන අංශය සඳහා (28%), දුරකථන සන්නිවේදන අංශය සඳහා (17%), හෝටල් අංශය සඳහා (10%), තොරතුරු තාක්ෂණ හා ව්‍යාපාර බාහිරකරණය සඳහා (4%) ආදි වශයෙන් ලැබී ඇත.

#### සෘජු විදේශ ආයෝජනයන්හි ආංශික ව්‍යාප්තිය




#### සෘජු විදේශ ආයෝජන කරන ලද ප්‍රධාන රටවල් 10



## ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ අපනයනය

2020 වසරේ ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ මුළු අපනයනය ඇ.ඩො.මිලියන 7,119ක් ලෙස වාර්තා වූ අතර එමගින් ජාතික අපනයනයෙන් 66%ක් සහ ජාතික කාර්මික අපනයනයෙන් 85%ක් නියෝජනය කෙරේ. ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ මුළු අපනයනයෙන් 60%ක් ඇඟළුම් හා රෙදිපිළි අංශයෙන්ද, 12%ක් රබර් අංශයෙන්ද, 5%ක් ආහාර හා පාන වර්ග අංශයෙන් හා 3%ක් ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් උපකරණ අංශයෙන් ද සමන්විතය. ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ සමස්ත අපනයනය සඳහා සේවා අංශයේ දායකත්වය 8%ක් විය.




## COVID-19 මධ්‍යයේ යථාතත්වයට පත් වීම – 2019 හා 2020 වසරවල වෙළඳ භාණ්ඩ අපනයනය



## 2020 වසරේ ප්‍රමුඛ ආයෝජන අංශ

| | |
|---|---|
| **රබර් අංශය** | අපේක්ෂිත ආයෝජනය ඇ.ඩො.මිලියන 300ක් වන අපනයන වෙළඳපළ සඳහා ටයර් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් පිහිටුවීම සඳහා ආයෝජන මණ්ඩලය ලොව ප්‍රමුඛ රබර් නිෂ්පාදක සමාගමක් වන චීනයේ Shandong Haohua Tire Co. Ltd සමග ගිවිසුමක් අත්සන් කරනු ලැබීය. මෙම වැදගත් ආයෝජනය මගින් රටේ රබර් කර්මාන්තයේ පුනර්ජීවනයක් ඇතිකරමින් රබර් සඳහා ඇති ඉල්ලුම වැඩිවන අතර ම අපනයන වෙළඳපල සඳහා නව මාවතක් විවරවනු ඇති බව අපේක්ෂා කෙරේ. |
| **දේපළ සංවර්ධනය** | CHEC වරාය නගරයේ මූල්‍ය මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා චීනයෙන් ඇ.ඩො. බිලියන එකක වටිනාකමකින් යුත් ආයෝජනයක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලැබීය.<br>ඇ.ඩො.මිලියන 222ක (Belluna Lanka Pvt Ltd, 100% දේශීය ආයෝජනයකි) ඇ.ඩො.මිලියන 200ක (Perenial Real Esatte Lanka Pvt Ltd., සිංගප්පූරුව හා ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ ව්‍යාපෘතියකි) සහ ඇ.ඩො.මිලියන 60ක (Baili Investments Lanka Pvt Ltd, චීනය හා හොං කොං මගින් 100% විදේශ ආයෝජනයකි) වටිනාකමකින් යුත් මහා පරිමාණ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති තුනක් ඉදිකිරීම සඳහා ආයෝජන මණ්ඩලය ගිවිසුම් අත්සන් කරන ලදී. |
| **ඖෂධ** | Laugfs Life Sciences (Pvt) Ltd, Synergy Pharmaceuticals Co. Ltd සහ Sands Active (Pvt) Ltd. යන සමාගම් 2020 වසරේදී ඉදිකිරීම් ආරම්භ කරනු ලැබීය. මෙම ව්‍යාපෘතවල අපේක්ෂිත ආයෝජනය පිළිවෙලින් ඇ.ඩො.මිලියන 23, ඇ.ඩො.මිලියන 16 හා ඇ.ඩො.මිලියන 10ක් වේ. |
| **ඇඟළුම්** | ඇ.ඩො.මිලියන 155ක වටිනාකමකින් යුත් ආයෝජනයක් සහිත පුද්ගල ආරක්ෂක උපකරණ (PPE) නිපදවීම සඳහා තම නිෂ්පාදන විවිධාංගීකරණය කිරීමට දැනට ක්‍රියාත්මක සමාගම් 52ක් සඳහා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලබාදෙන ලදී.<br>ආයෝජන මණ්ඩලය චීන ආයෝජකයෙකු සමග (Dongxia Industrial Lanka (PVT) Ltd.) අපේක්ෂිත ආයෝජනය ඇ.ඩො. මිලියන 99ක් වන අපනයන වෙළඳපල සඳහා ඇඟළුම් නිෂ්පාදනය කිරීම සඳහා ගිවිසුම් අත්සන් කරන ලදී. |
| **තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT)** | ප්‍රමුඛ ඉන්දීය ආයෝජකයෙකු වන HCL Technologies සමාගම ඇ.ඩො.මිලියන 10ක අපේක්ෂිත ආයෝජනයකින් යුත් තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතියක් ශ්‍රී ලංකාවේ ඉදිකිරීම සඳහා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමක් අත්සන් කරනු ලැබීය. පුහුණු පහසුකම් සපයන අතර තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශයේ රැකියා 2,500ක් ඇතිකිරීම HCL සමාගමේ අපේක්ෂාව වේ. |
| **දුරකථන සන්නිවේදනය** | ඩයලොග් ආසියාටා පීඑල්සී සමාගම (Dialog Axiata PLC) සහ ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (පෞද්ගලික) සමාගම (Dialog Broadband Networks (Pvt) Ltd) ආයෝජන මණ්ඩලය සමග ඇ.ඩො.මිලියන 250ක වටිනාකමකින් යුත් ව්‍යාපෘති පුළුල් කිරීමේ ගිවිසුමක් අත්සන් කරන ලද අතර මේ වන විට මෙම ව්‍යාපෘති දෙක ක්‍රියාත්මක කර ඇත.<br>භාර්ති එයාටෙල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (Bharti Airtel Lanka (Pvt) Ltd) ආයෝජන මණ්ඩලය සමග ඇ.ඩො.මිලියන 25ක වටිනාකමකින් යුත් ව්‍යාපෘති පුළුල් කිරීමේ ගිවිසුමක් අත්සන් කරන ලද අතර මෙම ව්‍යාපෘතිය මේ වන විට ක්‍රියාත්මක කර ඇත. |

# මෑතකාලීන ආරම්භයන්

## ආයෝජන මණ්ඩලයේ නව උපායමාර්ග: "ශ්‍රී ලංකාවේ සෘජු විදේශ ආයෝජන පිළිබඳ නැවත සිතා බැලීම"

ශ්‍රී ලංකාව සඳහා දශකයක වර්ධනයක් සඳහා ඉඩසලසමින්, ආයෝජන මණ්ඩලය "ශ්‍රී ලංකාවේ සෘජු විදේශ ආයෝජන පිළිබඳ නැවත සිතා බැලීම" යන තේමාව යටතේ තාත්වික කාලරාමුවන් සමගින් ආයෝජන ආකර්ෂණය කරගැනීමේ ප්‍රමුඛතාවන් හා අරමුණු පැහැදිලිව නිර්වචනය කරන ලද සිය නව උපායමාර්ග සකස් කරනු ලැබීය. රටේ නිසග හා තරගකාරී වාසි පිළිබඳ ගැඹුරු අධ්‍යයනයන් මෙන්ම කලාපීය තරගකරුවන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනයක් පදනම් කරගෙන සකස් කරන ලද මෙම නව උපායමාර්ග මගින් රටේ ආර්ථික පසුබිම වෙනස් කිරීම සහ ආයෝජකයින් සඳහා හිතකර ආයෝජන වාතාවරණයක් ඇතිකිරීම අරමුණු කෙරේ. ආයෝජන දිරිමත් කරන වාතාවරණය ඇතිකිරීම සහ ආයෝජකයින් සඳහා පහසුකම් සැලසීම සඳහා වැඩිදියුණු කළ යුතු ප්‍රධාන ක්ෂේත්‍ර මෙන්ම අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා වන ක්‍රියාමාර්ග හඳුනාගෙන ඇත. විශේෂයෙන්ම ඩිජිටල්කරණය හරහා සේවාවන් සඳහා ප්‍රවේශ වීමේ හැකියාව ක්‍රමවත් කිරීම සහ අනුමැතීන් ලබාගැනීම සඳහා වන පියවර හා ඒ සඳහා ගතවන පියවර හා කාලය අඩුකිරීම සඳහා අදාළ රේඛිය අමාත්‍යාංශ හා රජයේ වෙනත් ආයතන සමග කටයුතු කිරීම ආරම්භ කර ඇත.

"රටේ ආකර්ෂණීයබව" සහ "ආයෝජන මණ්ඩලය නවීකරණය" යන මූලික අරමුණු ඉලක්ක කර නව උපායමාර්ගය ඇතුළත් ලේඛණය සකස්කර ඇත. මෙම අරමුණු දෙක සංරචක 7ක ප්‍රවේශයක් හරහා විස්තරකර ඇත. එයට හිතකර ආයෝජන වාතාවරණයක් නිර්මාණය කිරීම, ඉලක්කගත ආයෝජන ආකර්ෂණය කිරීම සහ ආරම්භයේ සිට අවසානය දක්වා ආයෝජකයින් සඳහා සහයවීම ඇතුළත්වන අතර ආයතනය සංවිධානය වීම සහ කාර්ය මණ්ඩලය, තාක්ෂණය හා කාර්ය මණ්ඩලය අනුගතකර ගැනීම, ප්‍රධාන රාජ්‍ය හා පෞද්ගලික පාර්ශවකරුවන් සමග හවුල්කාරීත්වය සහ ක්‍රියාවලි අධීක්ෂණය හා ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය ඇතුළත් වේ.




ඉලක්කගත සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම සහ ආර්ථික වර්ධනය දිරිමත් කිරීම සඳහා සැකසුනු ප්‍රවේශයක් සහිත මෙම විස්තීර්ණ උපායමාර්ග මගින් ප්‍රමුඛ අංශ ඉලක්ක කෙරේ.

නව උපායමාර්ග මගින් පුළුල් අංශ පහක් සඳහා ප්‍රමුඛතාවය ලබාදී ඇත.

| | | |
|---|---|---|
| නිෂ්පාදනය | : | ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් උපකරණ, ඇඟළුම් හා ඖෂධ සඳහා අගය එකතු කිරීම පුළුල් කිරීම |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) | : | මෘදුකාංග වැඩිදියුණු කිරීම, ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය/දැනුම ක්‍රියාවලි කළමනාකරණය (BPM/KPM), තොරතුරු තාක්ෂණ පුහුණු/අධ්‍යාපන සහ නැගීඑන තාක්ෂණයන් |
| සත්කාරක සේවා හා සංචාරක කර්මාන්තය | : | සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන හා ප්‍රවර්ධන (MICE) සංචාරක කර්මාන්තය, ත්‍රාසජනක සංචාරක කර්මාන්තය, සුවථා හා පාරිසරික සංචාරක කර්මාන්තය |
| කෘෂිකර්මාන්තය හා ආහාර පිරිසැකසුම් කිරීම | : | රබර්, කෘෂි/පිරිසැකසුම් කරන ලද ආහාර හා මත්ස්‍ය නිෂ්පාදනය |
| ඉදිකිරීම්, යටිතල පහසුකම් හා කාර්යසම්පාදනය | : | වේගවත් ගමනාගමනය, වරාය, ගුවන් තොටුපළ හා කාර්යසම්පාදන යටිතල පහසුකම්. |

තොරතුරු සන්නිවේදන තාක්ෂණය, සත්කාරක සේවා හා සංචාරක කර්මාන්තය සම්ප්‍රදායික කර්මාන්තයන්ගෙන් වෙනස් වූ (Game-Changers) ක්ෂේත්‍ර ලෙස හඳුනාගෙන ඇති අතර කෘෂිකර්මාන්තය හා ආහාර පිරිසැකසුම් අංශය නව සැලසුමෙහි වේගවත් හා පුළුල් වර්ධනයක් සඳහා මග සලසන මූලික ක්ෂේත්‍රවේ. වැඩි ප්‍රවණතාවයක් ඇති වෙනත් හඳුනාගත් උප අංශ වන්නේ:

- ඖෂධ උප අංශය : ජෛව ඖෂධ, එන්නත්, ක්‍රියාකාරී ඖෂධීය සංඝටක අඩංගු ද්‍රව්‍ය (APIs), ස්වභාවික පෝෂණ නිස්සාරක (nutraceuticals) ආදිය.
- ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් උපකරණ උප අංශය : මිනිරන් හා ග්‍රැෆීන් ආශ්‍රිත නිෂ්පාදන, සංවේදක හා ස්විච, අන්තර්ජාලය හරහා ක්‍රියාත්මක (IOT) උපකරණ, මුද්‍රිත පරිපථ පුවරු (PCBs), විද්‍යුත් පැනල් පුවරු හා ජංගම දුරකථන ආදිය.
- වර්ධනයවන පාරිභෝගික ආර්ථිකයට මෙන්ම පුළුල්වන නිෂ්පාදන හා සේවා අංශ සඳහා සහයවීමට යටිතල පහසුකම් සහ කාර්යසම්පාදන අවශ්‍ය වේ.

නව සැලසුම මගින් ව්‍යුහගත ආයෝජකයින් ළඟාකර ගැනීම, වැඩසටහන් කළමනාකරණය, ආයෝජකයින් සඳහා පහසුකම් සැලසීම වැඩිදියුණු කිරීම, සහ පසු සත්කාරක සේවාවන් වැඩිදියුණු කළයුතු ක්ෂේත්‍ර ලෙස හඳුනාගෙන ඇති අතර ආයෝජන ප්‍රතිපත්තීන්හි විනිවිදභාවය සහ අනුකූලතාවය ආයෝජන ඉලක්ක කිරීමේ ආරම්භක හා ව්‍යුහාත්මක ප්‍රවේශයේ ප්‍රධාන සංරචක ලෙස හඳුනාගෙන ඇත. සිය ආයෝජන ළඟාකර ගැනීමේ උපාය මාර්ගික සැලසුමේදී දැනට පවතින වාණිජ වේදිකාවන් සඳහා පහසුකම් සැලසීම, රටතුළ වෙළඳ ප්‍රදර්ශන හා සංචාර සඳහා සත්කාරකත්වය දැක්වීම, විදෙස්ගත සහ ඩයස්පෝරා ජාල, වෙළඳ ආයතන සහ තානාපතිවරුන් ආදීන් හරහා ඍජුව ම පාර්ශවකරුවන් කරා ප්‍රවේශ වීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් සිය ආයෝජන ළඟාකර ගැනීමේ උපාය මාර්ගික ප්‍රවේශය තුළ ප්‍රධාන මාර්ග කීපයක් හඳුනාගෙන ඇත. මෙරට ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකාව ආයෝජන සඳහා යෝග්‍ය රටක් ලෙස ස්ථානගත කිරීම කෙරෙහි යොමු වූ ප්‍රචාරක වැඩසටහනක් අරමුණ කරගෙන ඉදිරි වසරේ දී සිය ප්‍රයත්නයට සහයවීම සඳහා ලොව පළමු පෙළේ උපදේශක සමාගමක සහ ජාත්‍යන්තර මහජන සම්බන්ධතා නියෝජිත ආයතනයක සේවාවන් ලබාගැනීමට මෙන් ම ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම සඳහා ප්‍රමුඛ ගෝලීය සමාගම් 500ක් ආකර්ෂණය කරගැනීමේ කාර්යයේ නිරතවීමට ද ආයෝජන මණ්ඩලය අරමුණු කෙරේ.

## සෘජු විදේශ ආයෝජන (FDI) කරා යොමුවූ ප්‍රමුඛ ක්ෂේත්‍ර පහ සඳහා උපායමාර්ගික ප්‍රවේශය

| නිෂ්පාදනය | තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT) | සත්කාරක සේවා හා සංචාරක කර්මාන්තය | කෘෂි කර්මාන්තය හා ආහාර පිරිසැකසුම් කිරීම | ඉදිකිරීම්, යටිතල පහසුකම් හා සැපයුම් සේවා |
|---|---|---|---|---|
| ▪ ඖෂධ<br>▪ ඉහළ අගයක් එක්කළ ඇඟළුම්<br>▪ ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් උපකරණ | ▪ මෘදුකාංග වැඩිදියුණු කිරීම, ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය / දැනුම ක්‍රියාවලි කළමනාකරණය (BPM/KPM), තොරතුරු තාක්ෂණ පුහුණු / අධ්‍යාපන සහ නැගී එන තාක්ෂණයන් | ▪ කෘෂි/පාරිසරික සංචාරක කර්මාන්තය<br>▪ ත්‍රාසජනක / විනෝදාත්මක සංචාරක කර්මාන්තය<br>▪ සුඛෝපභෝගී හෝටල්<br>▪ සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන හා ප්‍රවර්ධන (MICE) සංචාරක කර්මාන්තය | ▪ රබර්<br>▪ කෘෂි / පිරිසැකසුම් කරන ලද ආහාර<br>▪ මත්ස්‍ය නිෂ්පාදන | ▪ ඉක්මනින් සංක්‍රමණය වන වරාය හා ගුවන් තොටුපළ |

| | |
|---|---|
| ශක්තිමත් බහු නියෝජිතායතන හවුල්කාරිත්වයන් ස්ථාපනය කිරීම. | ▪ ශ්‍රී ලංකීය දූත මණ්ඩල හරහා විභව ආයෝජකයින් සමග ඵලදායි ලෙස කටයුතු කිරීම සඳහා ආයෝජන මණ්ඩලය හා විදේශ කටයුතු අමාත්‍යාංශය අතර සහයෝගීතාවය ඇතිකර ගැනීම.<br>▪ හඳුනාගත් අංශ හරහා විභව ආයෝජකයින් සමග සෘජුවම සම්බන්ධවීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් වාණිජ මණ්ඩල සමග සම්බන්ධිකරණය පහසුකිරීම. (CCC, ICC, FCCISL, ECCSL, JAAF, SAEA, SLASSCOM)<br>▪ ආයෝජන මණ්ඩලයේ ගෝලීය හවුල්කාරිත්වයන් මගින් වාණිජ මණ්ඩල ජාලය පුළුල් කරන අතරම රටතුළ සිදුකෙරෙන තොරතුරු හා දත්ත පද්ධතිවලට ප්‍රවේශවීමේ හැකියාව ලබාදී ඇති අතර එමගින් විභව්‍ය ආයෝජකයින් කරා ප්‍රවේශ වීම. (JICA, JETRO, KOTRA,AHK, UNIDO, Citi Bank, MUFG, Deutsche Bank, ADB, World Bank) |
| | |
| නව අපනයන සැකසුම් කලාප සංවර්ධනය කිරීම ආරම්භ කරන ලදී. | ▪ රෙදිපිළි සඳහා දේශිය ධාරිතාවය ගොඩනැගීම මගින් ඇඟළුම් අංශයේ අගයදාමයන් වැඩිකිරීම සඳහා එරාවූර් රෙදිපිළි නිෂ්පාදනය කිරීමේ කලාපය.<br>▪ ආනයන ආදේශක හරහා ඖෂධ ආනයන වියදම අඩුකරන අතරම නව අපනයන කර්මාන්තයක් ඇතිකිරීම සඳහා ඖෂධ නිෂ්පාදන කලාපයක් ඉදිකිරීම. |
| | |
| විශ්වාසනීය ආයෝජන වාතාවරණයක් ඇතිකිරීම | ▪ ආයෝජකයින්ට පූර්ව නිගමනයන් සහතික කිරීම සඳහා බදු ප්‍රතිපත්තියේ අනුකූලතාවය සහතික කිරීම.<br>▪ ආයෝජන මණ්ඩලය විසින් අත්සන් කරන ලද ගිවිසුම්වල ඇතුළත් විධිවිධාන සඳහන් කරන ලද කාලසීමාවක් සඳහා නොවෙනස්ව පැවතීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත සංශෝධනය කරමින් පවතී.<br>▪ එක හා සමාන රටවල් සමග තරග කිරීම සඳහා සුපරික්ෂාකාරීව සකස්කරන ලද අංශයට විශේෂිත දිරිදීමනා හඳුන්වාදීම.<br>▪ රටතුළ අවශ්‍ය නිපුණතා මට්ටම් තහවුරු කිරීම සඳහා වෘත්තීය පුහුණු ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.<br>▪ H1 2021 මගින් දේශීය හැකියාවන් සඳහා අවහිර නොකර ව්‍යුහගත වීසා වැඩසටහනක් ස්ථාපනය කිරීම.<br>▪ කම්කරු සුනම්‍යතාවය ලබාදීම සඳහා කම්කරු නීතිය නැවත සංශෝධනය කිරීම. |

උගත් හා නිපුණ ශ්‍රම බලකායක් පැවතීම විශ්වාසනීය ආයෝජන වටපිටාවක් තහවුරු කිරීම සඳහා තවත් මූලික සාධකයක් වේ. නැගී එන කර්මාන්ත, විශේෂයෙන් ම තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය සඳහා අවශ්‍ය විශේෂඥ දැනුම ඇති ශ්‍රම බලකායක් නොමැතිකම වර්තමානයේ විශාල ගැටළුවකි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අනුව රජයේ විශ්වවිද්‍යාල මගින් වසරකට උපාධිධාරීන් 16,000ක් බිහිවන අතර පෞද්ගලික විශ්වවිද්‍යාල සහ බාහිර උපාධි වැඩසටහන් මගින් උපාධිධාරීන් 15,000ක් බිහි වේ.

අනෙක් අතට දැනට පවතින වෘත්තීය පුහුණු ආයතන මගින් සිසුන් 130,000ක් සඳහා පුහුණුව ලබාදෙන නමුත් වර්තමානයේ මූලික වශයෙන් විවිධ නිෂ්පාදන අංශ හරහා නැගී එන තාක්ෂණික නිපුණතා සඳහා ඇති අවශ්‍යතාවයට අමතරව ශිල්පීය දක්ෂතා සඳහා ඇති ඉල්ලුම හා සැපයුම අතර පරතරයක් පවතී.

විශ්වවිද්‍යාලවලින් පිටවන මූලික ශිල්පීය දක්ෂතා හඹායන උපාධිධාරීන් වැඩිකිරීම සහ අනෙක් උපාධිධාරීන්ගේ ශිල්පීය දක්ෂතා වැඩිදියුණු කිරීම හා ශිල්පීය දක්ෂතා ඇතිකිරීම මගින් ශ්‍රම බලකාය පිළිබඳ අවහිරතා අවම කළහැකි බව ආයෝජන මණ්ඩලයේ මතයයි. තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපාධිධාරීන් ප්‍රමාණය 25,000 දක්වාත්, ඉංජිනේරු හා විද්‍යා උපාධිධාරීන් 10,000 දක්වා ද කෘෂිකර්මාන්ත උපාධිධාරීන් 1,000 දක්වා සහ කළමනාකරණ උපාධිධාරීන් 6,000 සිට 10,000 දක්වාත් වැඩිකිරීම, අපේක්ෂිත මධ්‍යකාලීන ඉලක්කය වේ.

සුවිශේෂී ක්ෂේත්‍රයන්හි විශේෂයෙන් ම තොරතුරු සන්නිවේදන තාක්ෂණය හා ඉංජිනේරු ක්ෂේත්‍රයන්හි උපාධි පිරිනමන පෞද්ගලික විශ්වවිද්‍යාල කීපයක් හෝ ස්ථාපනය කිරීම සහ රජයේ විශ්වවිද්‍යාල මගින් පිටවන උපාධිධාරීන් ප්‍රමාණය වැඩිකිරීම මගින් මෙම ඉලක්කය ළඟාකර ගත හැකිවේ. වෘත්තීය පුහුණු ආයතනවලින් පිටවන සිසුන් සංඛ්‍යාව 1.5 ගුණයකින් වැඩිකිරීම හා ඔවුන්ට ශිල්පීය නිපුණතා ලබාදීම අනෙක් යෝජනාවයි.

## 2020 වසරේදී ආරම්භ කරන ලද නව අපනයන සැකසුම් කලාප සංවර්ධනය කිරීම

***(i)*** *ඖෂධ නිෂ්පාදන කලාපය - හම්බන්තොට*

උසස් තත්වයේ ඖෂධ දේශීයව සැපයීම මගින් ශ්‍රී ලංකාවට සුවිශාල ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ ගෙනදිය හැකි සහ අපනයනය මගින් විදේශ විනිමය ඉපයීමේ ප්‍රවණතාවක් ඇති කර්මාන්තයක් ලෙස ඖෂධ කර්මාන්තය හඳුනා ගනු ලදුව, ලොව ප්‍රසිද්ධ ආයෝජකයින් ආකර්ෂණය කරගැනීම සඳහා උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස අතිනවීන ඖෂධ නිෂ්පාදන කලාපය ආරම්භකර තිබේ.

යෝජිත ඖෂධ නිෂ්පාදන කලාපය උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආරබොක්ක ප්‍රදේශයේ ස්ථාපනය කරනු ලබන අතර අදියර දෙකකදී අක්කර 400ක ප්‍රදේශයක් තුළ සංවර්ධනය කෙරේ. පළමු අදියරේදී ඖෂධ සමාගම් 20ක් ස්ථාපනය කිරීම සඳහා අක්කර 200ක ප්‍රදේශයක් සංවර්ධන කරනු ලබන අතර දෙවන අදියරේදී ඉතිරි අක්කර 200ක ප්‍රදේශයේ ඖෂධ සමාගම් 20ක් ඉදිකරනු ඇත. 2021 වසරේ පළමු කාර්තුව අවසානයේ කලාපයේ ව්‍යවසායයන් ඉදිකිරීම ආරම්භ කිරීමට සැලසුම්කර ඇති අතර යටිතල පහසුකම් සම්පූර්ණ වීමත් සමග 2021 වසර අවසානයේ පළමු අදියරේ කටයුතු ආරම්භ කරන අතර 2024 වනවිට නිෂ්පාදන වෙළඳපලට නිකුත් කෙරේ.

***(ii)*** *රෙදිපිළි නිෂ්පාදන කලාපය (එරාවූර්)*

එරාවූර්හි අක්කර 300ක වපසරියකින් යුත් භූමියක ඉදිකිරීමට යෝජිත කාර්මික කලාපය දේශිය හා ජාත්‍යන්තර වෙළඳපල යන දෙකටම රෙදිපිළි සැපයීම සඳහා රෙදිපිළි නිෂ්පාදන උද්‍යානයක් ලෙස ස්ථාපනය කරනු ඇත. උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස ප්‍රකාශයට පත්කරනු ලබන මෙම කලාපය මගින් රෙදි ආනයනය සඳහා වැයවන විදේශ විනිමය අඩුවීම සහ අමුද්‍රව්‍ය බෙදාහැරීමේ වේගය වැඩිවීමක් සමග සංසන්දනාත්මක අඩු පිරිවැයකට නියමිත වේලාවට අමුද්‍රව්‍ය සැපයීම මගින් රටට මෙන්ම ඇඟළුම් කර්මාන්තයට සුවිශාල අවස්ථාවක් අත්කර දෙනු ඇත. මෙමගින් සම්භවය පිළිබඳ නීති නිර්නායක සපුරාලීම මගින් ඇඟළුම් නිෂ්පාදකයන්ට ද්විපාර්ශ්වික හා ඒකපාර්ශ්වික ගිවිසුම් (EU GSP+, ISFTA, SLPFTA) මගින් සලසා ඇති සහන සඳහා සුදුසුකම් ලැබීමේ මග සැලසේ. මෙම එරාවූර් කාර්මික කලාපයේ ඉදිකිරීම් කාර්යයන් කඩිනම් කිරීමට සහ 2021 වසර තුළ මෙහෙයුම් ආරම්භ කිරීමට අපේක්ෂා කරන අතර මේ වනවිට ආයෝජකයින් කිහිප දෙනෙකුම එහි රෙදි කර්මාන්තශාලා ඉදිකිරීමට කැමැත්ත පළකර ඇත.

# COVID-19 සමග ඉදිරි කටයුතු සැලසුම් කිරීම

COVID-19 වසංගතය දිගින් දිගටම ලොවපුරා වේගයෙන් ව්‍යාප්ත වන නිසා අපගේ ව්‍යාපාරික ප්‍රජාව කෙරේ ඇතිවන බාධාකාරී බලපෑම් අවම කිරීම සඳහා ක්ෂණික ක්‍රියාමාර්ගයන්ට අවතිර්ණ වීම පිණිස ක්‍රමිකව නැගී එන ගෝලීය ආර්ථිකය හා ව්‍යාපාරික වෙළඳපල අඛණ්ඩව සකස් කිරීම පිළිබඳව ආයෝජන මණ්ඩලය සමීපව අධීක්ෂණය කරනු ලැබේ. ආයෝජන මණ්ඩලය, වෙනස්වන ආර්ථික අවකාශය භෞමික ප්‍රක්ෂේපණයට ගැලපෙනසේ දෛනික දිවිපෙවෙත අනුවර්තනය කරගනිමින් ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් හා ඒවායේ කාර්ය මණ්ඩලය මෙන්ම ඒ හා සම්බන්ධවන ප්‍රජාවන් හැකි පමණ ආරක්ෂිතව තබාගැනීම සඳහා වඩාත් ම සුදුසු ක්‍රියාමාර්ග තීරණය කිරීම සම්බන්ධයෙන් ආයෝජක ප්‍රජාවට උපදෙස් ලබාදීම සිදුකරයි. මෙම අරමුණු ළඟාකර ගැනීම සඳහා අනුගමනය කිරීමට වඩාත් සුදුසු ක්‍රමවේද පිළිබඳව ආයෝජන මණ්ඩලයට වෙනත් පාර්ශවකාර ආයතන මගින් උපදෙස් ලැබෙන අතර සෞඛ්‍ය හා ආරක්ෂක අංශයේ විශේෂඥයින්ගෙන් මාර්ගෝපදේශ ලැබේ.

❖ **ආයෝජන මණ්ඩලයේ අපනයන සැකසුම් කලාපයන්හි අඛණ්ඩ මෙහෙයුම් තහවුරු කිරීම**

රටපුරා ඇඳිරි නීතිය පැනවීමත් සමග රටේ හදිසි තත්වයක් ප්‍රකාශයට පත්කරනු ලැබූවද ආයෝජන මණ්ඩලයේ අපනයන සැකසුම් කලාපවල ව්‍යවසායයන් COVID-19 වසංගතය මධ්‍යයේ ව්‍යාපාරික මෙහෙයුම් නැවත ආරම්භකර බිඳවැටීමකින් තොරව අඛණ්ඩව නිෂ්පාදන ක්‍රියාවලිය සිදුකිරීමේ සිය අවශ්‍යතාවය ප්‍රකාශ කරනු ලැබීය. එබැවින් කලාපයන්හි ව්‍යවසායයන්ට පහසුකම් සලසන ආයතනය වශයෙන් ආයෝජන මණ්ඩලය විසින් අදාළ බලධාරීන්ගෙන් අවශ්‍යකරන අනුමැතීන් ලබාගැනීම මගින් වසංගත තත්වය මධ්‍යයේ සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට සහ අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා පහත දක්වා ඇති පරිදි විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබීය.

- **පරිශ්‍රයන්හි යෝග්‍යතාවය සහතික කිරීම**

  ව්‍යවසායයන්හි මෙහෙයුම් ආරම්භ කිරීමට පෙර සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත්කර ඇති මාර්ගෝපදේශයන්ට අනුව එම ව්‍යවසාය පරිශ්‍රයන්හි යෝග්‍යතාවය තහවුරුකර ගැනීම සඳහා පරීක්ෂා කිරීම් සිදුකිරීමට ආයෝජන මණ්ඩලය මහජන සෞඛ්‍යය පරීක්ෂක නිලධාරීන්ගේ (PHI) සහය ලබාගනු ලැබීය. මහජන සෞඛ්‍යය පරීක්ෂක නිලධාරීන් විසින් ලබාදෙනු ලබන නිර්දේශයන්ට අනුව යම් කාලසීමාවකදී අවම සේවක පිරිසක් කැඳවීමට ව්‍යවසායයන්ට ඉඩ සලසනු ලැබූ අතර සියලුම ව්‍යවසායයන් අවශ්‍ය සෞඛ්‍යාරක්ෂක පහසුකම් සියල්ල සපුරා ඇති බවට සහතික කරනු ලැබීය.

- **ඇඳිරි නීති බලපත්‍ර ලබාගැනීම සඳහා නිර්දේශ නිකුත් කිරීම**

  කලාපයන්හි සේවකයින්ට තම නිවෙස්වල සිට සේවා ස්ථාන කරා ගමන් කිරීම සඳහා එම සේවකයින්ට හා වාහනවලට පොලීසිය මගින් ඇඳිරිනීති බලපත්‍ර ලබාගැනීමට හැකිවන පරිදි නිර්දේශ නිකුත් කිරීමේ ක්‍රියාවලියක් ආයෝජන මණ්ඩලය විසින් ආරම්භ කරනු ලැබීය. බොහෝ ව්‍යවසායයන් කම්කරු අමාත්‍යවරයා සභාපතිත්වය දරන ත්‍රෛපාර්ශවික කාර්යසාධන බලකාය විසින් ඉල්ලා ඇති පරිදි වසංගත කාලය තුළ වැටුප් ගෙවමින් තම සේවකයින් සේවයේ නිරත කරවන ලද අතර සමහර ව්‍යවසායයන් සේවකයින්ට නිවසේ සිට රාජකාරි කිරීමට අවකාශ සලසනු ලැබීය.

- **ආනයන හා අපනයන ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීම**

  සෞඛ්‍යය නියෝගයන්ට හා මෙහෙයුම් මාර්ගෝපදේශයන්ට අනුගතවීම සඳහා සහය ලබාදෙන අතරම ආයෝජන මණ්ඩලය විසින් සියලු ව්‍යවසායයන්ට තම ආනයන හා අපනයන ක්‍රියාවලි සඳහා පහසුකම් සලසමින් අඛණ්ඩව සේවාවන් සපයනු ලැබීය. ආයෝජන මණ්ඩලය විසින් ව්‍යවසායයන්හි කළමනාකාරීත්වය හා සෞඛ්‍යය නිලධාරීන්, කම්කරු දෙපාර්තමේන්තුවේ හා පොලීසියේ නිලධාරීන් අතර සාකච්ඡා මාලාවක් සංවිධානය කරනු ලැබූ අතර එමගින් යම් සැකයක් තිබේ නම් එය නිරාකරණය කරගැනීමට හා වසංගත කාලය තුළ බාධාවකින් තොරව සිය මෙහෙයුම් කටයුතු ඉදිරියට ගෙනයාමට අවස්ථාව සලසනු ලැබීය.

- **ආයෝජන මණ්ඩලයීය අපනයනකරුවන් සඳහා කඩදාසි රහිත ආනයන හා අපනයන ලේඛන ක්‍රියාවලිය**

  වසංගතය දරුණු ම කාලයේ දී පනවනු ලැබූ සංචරණ සීමාවන් හේතුවෙන් ආනයන අපනයන ලේඛන සඳහා අනුමැතීන් ලබාගැනීමට පැමිණීමට නොහැකිවීමේ ගැටළුවට විසඳුම් ලබාදීම සඳහා ආයෝජන මණ්ඩලය ශ්‍රී ලංකා රේගුව සමග සාකච්ඡාකර සිය ව්‍යවසායයන් සඳහා කඩදාසි රහිත ආනයන අපනයන ලේඛන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරනු ලැබීය. අපනයන රේගු සටහන්කර (CUSDECs) සඳහා වන මෙම කඩදාසි රහිත ලේඛන ක්‍රියාවලිය කොළඹ, කටුනායක හා බියගම ප්‍රලේඛන මධ්‍යස්ථානයන්හිදී දැනටත් ක්‍රියාත්මකව පවතී.

  රේගු බදු අදාළ නොවන තෝරාගත් අමුද්‍රව්‍ය ආනයනය සඳහා ඉහත මාර්ගගත අනුමත කිරීමේ පහසුකම හඳුන්වාදී තිබේ. තනි කවුළුවේ (Single Window) පහසුකම් ක්‍රියාත්මක කිරීමත් සමග ආයෝජන මණ්ඩලයීය සමාගම් මගින් පිරියත හා යන්ත්‍ර ඇතුලු සියළු ආනයනන් සඳහා සම්පූර්ණයෙන් ම කඩදාසි රහිත විසඳුමක් ක්‍රියාත්මක කරනු ඇත.

### ❖ දැනුවත් කිරීම්

COVID-19 සඳහා අවධානයෙන් සිටීම හා ප්‍රතිචාර දැක්වීම පිළිබඳ මෙහෙයුම් මාර්ගෝපදේශ, පොලිස් මූලස්ථානය විසින් නිතුත් කරන ලද චක්‍රලේඛ හා සෞඛ්‍යය අමාත්‍යාංශයේ වසංගත විද්‍යා අංශය විසින් පළකරන ලද පෝස්ටර් සියලුම ව්‍යවසායයන්ට බෙදා දෙනු ලැබූ අතර මෙම මාර්ගෝපදේශ යටතේ මෙහෙයුම් කටයුතු සිදුකිරීම සඳහා ව්‍යවසායයන්හි කළමනාකාරීත්වය දැනුවත් කරනු ලැබීය. රෝගය පිළිබඳව හා ඉන් වැළකීමේ දැනුම ලබාදීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහය ඇතිව මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහන් හා ආයතනික දැනුවත් කිරීමේ/ අධීක්ෂණය කිරීමේ වැඩසටහන් පවත්වන ලද අතර COVID-19 වසංගතය හා අදාළ තොරතුරු හුවමාරුකර ගැනීම සඳහා ආයෝජන මණ්ඩලයීය ව්‍යවසායයන්හි කේන්ද්‍රීය ලක්ෂය ඉලක්කකර ක්‍රියාකාරී සෞඛ්‍යය කමිටු ස්ථාපනය කරන ලදී.

### ❖ නිෂ්පාදන විවිධාංගීකරණය සඳහා අවසර ලබාදීම

ව්‍යවසායයන් විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් අනුව නිෂ්පාදන විවිධාංගිකරණය සඳහා ආයෝජන මණ්ඩලය මගින් ඉඩ සැලසේ. 2020 ප්‍රථම භාගය අවසානය වනවිට COVID-19 ගෝලීය වසංගතය හේතුවෙන් පුද්ගල ආරක්ෂක උපකරණ (PPEs) සඳහා ලොවපුරා වැඩිවන ඉල්ලුම සලකා බලා අමතර ක්‍රියාකාරකමක් ලෙස එම නිෂ්පාදනයන්හි නියලීම සඳහා සමාගම් 52කට පමණ අනුමැතිය ලබාදෙනු ලැබීය. මෙම අමතර නිෂ්පාදනය අපනයනය මගින් 2021 අප්‍රේල් - 2021 ජනවාරි දක්වා කාලසීමාව තුළ රටට ඇ.ඩො. මිලියන 136.4ක අමතර විදේශ විනිමයක් උත්පාදනය විය.

### ❖ ආයෝජන මණ්ඩලයේ ගාස්තු සඳහා වාරික ගෙවීමේ සැලසුම

වසංගත කාලසීමාව තුළ මෙහෙයුම් කටයුතු සඳහා බාධා ඇතිවීම හේතුවෙන් මුහුණදීමට සිදු වූ මූල්‍යමය දුෂ්කරතා සලකා ආයෝජන මණ්ඩලයට ගෙවිය යුතු ගාස්තු, උදාඃ- අදාළ පරිදි වාර්ෂික ගාස්තු/බිම්කුලී, වාරික පදනමින් ගෙවීමට ඉඩ සැලසීම මගින් ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යවසායයන් සඳහා සහනයක් සලසනු ලැබීය.

## ❖ නිෂ්පාදන සමාගම් සඳහා ආනයන සීමා පැනවීම පිළිබඳව ආයෝජන මණ්ඩලයේ මැදිහත්වීම

ආර්ථිකය නගාසිටුවීම හා COVID-19 වසංගතයේ බලපෑම අඩුකිරීමේ ප්‍රයත්නයෙහි කොටසක් ලෙස මුදල් අමාත්‍යාංශය විසින් සමහර අමුද්‍රව්‍ය ආනයනය සම්බන්ධයෙන් තාවකාලික සීමාකිරීම් පනවනු ලැබීය. ශ්‍රී ලංකා රුපියලේ අගය ස්ථායි කිරීම හා ගෙවුම් ශේෂය කෙරෙහි ඇතිවන අහිතකර බලපෑම අවම කිරීම අරමුණු කරගෙන මෙම සීමාකිරීම් පනවනු ලැබූවද එමගින් නිෂ්පාදන අංශය සඳහා ද සීමාවන් ඇතිකරනු ලැබීය.

මෙම විශේෂිත වාතාවරණය යටතේ අපනයන ඉලක්ක කරගත් සමාගම්වල නිෂ්පාදනයන් හා මහා පරිමාණ ව්‍යාපෘති අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා ආයෝජන මණ්ඩලයීය සමාගම්වලට හැකි ඉහළම මට්ටමින් බදු සහන ලබාදීමට බදු උපදේශන කමිටුව හරහා ආයෝජන මණ්ඩලය මැදිහත් විය.

## ❖ ශ්‍රී ලංකාවෙන් පුද්ගල ආරක්ෂක උපකරණ (PPE) අපනයනය හෝ ප්‍රතිඅපනයනය සඳහා පනවනු ලැබූ සීමාකිරීම්

2020 මාර්තු 20වන සිකුරාදා දිනැති අංක 2167/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද වෛද්‍ය උපකරණ (ශ්‍රී ලංකාව තුළ ලබාගත හැකි) නියෝග මාලාව නමින් හැඳින්වෙන 2020 අංක 2 දරන නියෝග මගින් 'පුද්ගල ආරක්ෂක උපකරණ ඇතුළු යම් වෛද්‍ය උපකරණයක් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම හෝ ප්‍රතිඅපනයනය කිරීම' වළක්වා ඇත. දේශීය අවශ්‍යතාවය ආරක්ෂා වී ඇති බව තහවුරු කරමින් අදාළ බලධාරීන්ට පුද්ගල ආරක්ෂක උපකරණ අපනයනය හා බෙදාහැරීම පිළිබඳ සීමාකිරීම් ලිහිල් කිරීමේ වැදගත්කම ඒත්තු ගැන්වීමට ආයෝජන මණ්ඩලයට හැකිවිය.

සාමාන්‍යයෙන් අපනයන ඉලක්ක කරගත් ආයෝජන මණ්ඩලයීය සමාගම්වලට බදු සහන සඳහා සුදුසුකම් ලැබීමට ඒවායේ නිපයුම්වලින් 80%ක් අපනයනය කිරීම අවශ්‍ය කෙරේ. තවද අපනයන ඉලක්ක කරගත් සමාගමකට ආනයනික යෙදවුම් සඳහා රේගු බදු හා වෙනත් අදාළ බදු ගෙවීමට යටත්ව එහි මුළු නිපයුම්වලින් 20%ක උපරිමයක් දක්වා පමණක් දේශීය වෙළඳපලට සැපයීම සඳහා අවසර හිමි වේ.

ජාතික අවශ්‍යතාවයක් සේ සලකා කාලීන අවශ්‍යතාවය අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය හා දේශීය වෛද්‍ය සේවාවන්, සෞඛ්‍යය සේවා දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලීසිය හා COVID මධ්‍යස්ථානය වැනි රාජ්‍ය ආයතනවලට ඒවායේ ඉල්ලීම් අනුව ආයෝජන මණ්ඩලය අනුමත කරන පරිදි දේශීය වෙළඳපලට සැපයීම සඳහා අනුමත ප්‍රමාණය නොසළකා ආයෝජන මණ්ඩලය සමග එකඟව ඇති අදාළ ගිවිසුම් යටතේ පුද්ගල ආරක්ෂක නිෂ්පාදන හා පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම/පරිත්‍යාග කිරීම සඳහා මෙම අපනයන ඉලක්ක කරගත් සමාගම්වලට අනුමැතිය ලබා දී ඇත.

එකී ආයතන සඳහා ලබාදෙන මෙම සැපයුම්/පරිත්‍යාග බදු ආනයන ප්‍රතිස්ථාපනයන් ලෙස සැලකීමට හා එකී සැපයුම්/පරිත්‍යාග මගින් උපයන ලද ආදායම අපනයන ආදායමක් ලෙස සළකා සහනදායි ආදායම් බදු ප්‍රතිශතයක් (14%) අදාළකර ගැනීමට මෙන් ම එකී ආයතන වෙත ලබාදෙනු ලැබූ සැපයුම්/පරිත්‍යාග, රේගු බදු, වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බදු, සෙස් බදු, අගය එකතුකරන ලද බදු ඇතුළු සියලු අදාළ බදු හා තීරුබදුවලින් නිදහස් කළ යුතු බවට ආයෝජන මණ්ඩලය විසින් මුදල් අමාත්‍යාංශයට යෝජනා කෙරේ.

# අපගේ කාර්ය මණ්ඩලය

රටට හා ජනතාවට ආර්ථික සහ සමාජ සංවර්ධනය උදාකර දීමේ කාර්යයේදී ආයෝජන මණ්ඩලයට ඉමහත් ශක්තියක් වන්නේ සිය කාර්ය මණ්ඩලයයි. රාජ්‍ය සේවය සඳහා හෘදයාංගමව කැප වූ ආයෝජන මණ්ඩලයේ කණ්ඩායම රටට සෞභාග්‍ය උදාකර දීමේ දී උපරිම සහය ලබාදේ. මෙම ජාතික වගකීම ඉටුකිරීමෙහිලා අවශ්‍ය පෞද්ගලික හා වෘත්තීය සහය ලබාදීම මගින් ආයෝජන මණ්ඩලය තුළ ඔවුන්ගේ කාර්යයන් සඳහා නිරන්තරයෙන් දිරිමත් කෙරේ.

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, අර්ධ රාජ්‍ය අංශයේ ප්‍රමුඛ ආයතනයක් .......

1978 වසරේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ආරම්භයේ පටන් ම රටපුරා විවිධ සමාජ පසුබිම්වල සිටින ජනතාව සඳහා රැකියා අවස්ථා සළසා දී ඇත. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ රැකියා අවස්ථා සොයායන ජනයා අතර වැඩිම ඉල්ලුමක් ඇති ආයතයක් ලෙස අඛණ්ඩව පවතී. අප රට ආයෝජන ජාත්‍යන්තර තලයට ගෙනයාම සඳහා සිය කණ්ඩායම ශක්තිමත් හා විශ්වාසී බව තහවුරු කිරීම සඳහා ආයෝජන මණ්ඩලය සෑමවිට ම ආයතනය තුළ ප්‍රමිතින් පවත්වාගෙන ඇත. ව්‍යාපාරයන්හි ව්‍යුහය හා ස්වභාවය අනුව විවිධ හැකියාවන් හා දක්ෂතා සහිත සංචිතයක් ඇති කිරීමට ආයෝජන මණ්ඩලයට හැකිව තිබේ.

## කාර්ය මණ්ඩලය කළමනාකරණය සඳහා ආයෝජන මණ්ඩලයේ ප්‍රවේශය

ආයෝජන මණ්ඩලය ප්‍රායෝගික හා ජනතා කේන්ද්‍රීය ක්‍රියාමාර්ග අනුගමනය කරන ආයතනයක් වේ. අපගේ ක්‍රියාමාර්ග මගින්, ආයතනයට මෙන්ම සමස්තයක් ලෙස රටට ද අගයක් එක්කරන තෘප්තිමක් හා උද්යෝගිමත් ශ්‍රම බලකායක් තහවුරු කෙරේ. කාර්ය මණ්ඩල කළමනාකරණය බඳවා ගැනීම සහ මානව සම්පත් සංවර්ධනය සඳහා තෝරාගැනීම, සුභසාධනය හා විනය දක්වා පරාසයක් තුළ විහිදේ. මෙම සියලු කාර්යයන් යටතේ මානව සම්පත් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේදී සමානාත්මතාවය, අපක්ෂපාතීත්වය මෙන්ම ආචාරධර්ම අනුව කටයුතු කිරීමට ආයෝජන මණ්ඩලය අවධාරණය කෙරේ. අර්ධ රාජ්‍ය ආයතනයක් වශයෙන් මහජනයාට සේවය කිරීම සඳහා ආයෝජන මණ්ඩලයේ කණ්ඩායම විසින් එක්ව කටයුතු කරනු ලැබේ. එනිසා අප කාර්ය මණ්ඩලය සියලු මානව සම්පත් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඉහළ ම මට්ටමේ සමානාත්මතාවයක් පෙන්නුම් කරන අතර රජයේ නීති, නියෝග හා ප්‍රතිපත්ති තීරණයන්ට අනුකූලවතාවය තහවුරු කරමින් කටයුතු කරනු ලැබේ. සැලකිය යුතු අයුරින් ජාතික ආර්ථිකය රඳාපවතින වැදගත් ජාතික ආයතනයක් ලෙස ආයෝජන මණ්ඩලය මෙම ජාතික වගකීම ඉටු කිරීමේදී ආයතනයේ වගකීම අවතක්සේරු නොකරන අතර තම කණ්ඩායම ඒ කරා මෙහෙයවීමේ වගකීම ද එහි මානව සම්පත සතුවේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ස්ථාපනය කිරීමේ සිටම, එහි ක්‍රියාත්මක ප්‍රතිපත්ති හා පාලන රාමුව ආයතනයේ පැන නගින හා වෙනස්වන වටපිටාවට සරිලන පරිදි ස්වභාවිකව ම වෙනස්කම්වලට ලක්වේ. අනුකූලතාවය හා විශ්වාසනීයත්වය සැලකුවිට රජයේ ආයතනයන්හි සුරක්ෂිතතාවය සඳහා හඳුන්වා දී ඇති මෙම ප්‍රතිපත්ති මගින් ආයෝජන මණ්ඩලය සඳහා මාර්ගෝපදේශ සැලසේ. තවද මෙම ප්‍රතිපත්ති මගින් රජයේ ආයතනවල අභ්‍යන්තර කාර්යයන් සම්බන්ධයෙන් මඟ පෙන්වීම සිදුවේ. එසේ ලබාදෙන නියාමන මාර්ගෝපදේශ මගින් කාර්ය මණ්ඩල කළමනාකරණය සම්බන්ධයෙන් යහ පිළිවෙත් ක්‍රියාත්මකවන බව හා මැදිහත්වීම ආරක්ෂිත බව තහවුරු කිරීමට හැකිවන අතර සියලු කාර්ය මණ්ඩලයට සමාන සහයක් ලබාදීමට ආයතනයට සහය වේ. අධ්‍යාපනය එක් විශේෂ කණ්ඩායමකට පමණක් සීමා නොවී ආයතනයේ සියලු සේවකයින්ට ප්‍රතිලාභ ලැබෙන බව තහවුරු කරගැනීම සඳහා පුහුණු හා සංවර්ධන කටයුතුවලදී නම්‍යශීලී ප්‍රවේශයකට අනුගතව ඇත. සේවකයින්ගේ ශ්‍රේණිය හෝ තනතුර නොසළකා ඔවුන් සියලුදෙනා සඳහාම එක හා සමානව සුභසාධක මෙන්ම විනයානුකූල ක්‍රියාමාර්ග ගනු ලැබේ. ආයෝජන මණ්ඩලය තුළ සේවකයින්ගේ හැසිරීම පවත්වා ගැනීම සඳහා ඉවහල්වන පාලන ප්‍රතිපත්ති පවතී. රාජ්‍ය සේවකයින් වෙතින් අපේක්ෂා කරණ උසස් සේවා ආචාරධර්ම පවත්වා ගැනීම සඳහා ආයෝජන මණ්ඩලය සිය කාර්ය මණ්ඩලය දිරිමත් කරන අතර එකී ප්‍රතිපත්ති නොසළකා හරින විටක විධිමත් ක්‍රියාවලියක් හරහා කටයුතු කරන බව තහවුරු කෙරේ.




*"අර්ධ-රාජ්‍ය ආයතනයක් ලෙස හඳුනා ගනු ලැබුවද, ආයෝජන මණ්ඩලය රාජ්‍ය හා පෞද්ගලික අංශය යා කරන මූලික හා සෘජු අතුරු මුහුණතක් ලෙස කටයුතු කරනු ලබයි. එබැවින් සේවාව අරමුණු කරගත් පෞද්ගලික අංශයේ මානසිකත්වයක් හා සේවා ආචාරධර්ම අප සියලු සේවකයින් සතුවිය යුතුය"*

## මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොත




බඳවාගැනීම හා තෝරාගැනීම, සේවකයින් පත්කිරීම, වේතන, වැඩකරන පැය, පැමිණීම හා නිවාඩු, පරිවාස කාලය හා සේවය ස්ථිර කිරීම, කාර්යසාධනය ඇගයීම සහ පුහුණු හා සංවර්ධනය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොතට අනුකූලව ක්‍රියාත්මක කෙරේ. තවද මෙම ප්‍රතිපත්ති අත්පොත මගින් උසස්වීම්, මාරුකිරීම් හා සේවයෙන් පහත දැමීම, කාර්ය තත්වයයන්, දුක් ගැනවිලි මෙන්ම ඊට අනුගතව සිදුකළ යුතු සේවක සංගම් පිළිබඳ කටයුතු සම්බන්ධයෙන් මාර්ගෝපදේශ ලබාදේ. මෙම අත්පොතට අනුකූලව අප ජනතා කේන්ද්‍රීය හා සියලු දෙනාට ම සාධාරණ ලෙස කටයුතු කරන බව තහවුරු කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂ අනුමැතිය යටතේ මෙම ප්‍රතිපත්ති වලින් බැහැරව කටයුතු කිරීම සාධාරණීකරණය කළ හැකි සුවිශේෂී අවස්ථාවක දී හැර ආයෝජන මණ්ඩලය ස්ථිරව ම මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොතට අනුගතව කටයුතු කරනු ලැබේ.

## බඳවා ගැනීමේ පරිපාටිය

බඳවා ගැනීම් සිදු කිරීමේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට දැඩි ලෙස අනුකූලව කටයුතු කෙරේ. මෙම යෝජනා ක්‍රමය මගින් අභ්‍යන්තරව හා බාහිරව අවශ්‍ය නිපුණතා සහිත කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කිරීමේදී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ සහ සළකා බැලිය යුතු නිර්ණායක පැහැදිලිව දක්වා ඇත.

## ආයතන සංග්‍රහය

ඉතා ඉහළ මට්ටමේ වෘත්තීයභාවයක් හා සේවා ආචාරධර්ම මනාලෙස පවත්වා ගැනීම කෙරෙහි අප විශ්වාසය තබා ඇත්තෙමු. ආයෝජන මණ්ඩලයේ ආයතන සංග්‍රහය එහි සියලුම සේවකයින් විසින් පිළිපැදිය යුතු පැවතුම් අචාරධර්ම පැහැදිලිව දක්වන ලද විධිමත් ලේඛණයකි. ආයතන සංග්‍රහයේ "විනය ක්‍රියාමාර්ග නීති" යටතේ විෂමාචාරයක යෙදීමේ හෝ නීතියට එරෙහිව ක්‍රියාකිරීමේ සිද්ධියකදී විධිමත් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග දක්වේ.

## අප කාර්ය මණ්ඩලයේ සංයුතිය

ආයෝජන මණ්ඩල කණ්ඩායම කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයේ සහ දිවයින පුරා පිහිටි අපනයන සැකසුම් කලාප/උද්‍යාන/ප්‍රාදේශීය කාර්යාලයන්ට අනුයුක්ත සමස්ත සේවක සංඛ්‍යාව 1,297කින් සමන්විත වේ. අපගේ සේවක සංඛ්‍යාව කාණ්ඩ තුනකට අයත්වේ.

**විධායක 47%**

**විධායක නොවන සහ ප්‍රාථමික ශ්‍රේණි 53%**

අප කණ්ඩායමේ 47% ප්‍රධාන කාර්යාලයට හා අපනයන සැකසුම් කලාපයන්ට අනුයුක්ත විධායක නිලධාරීන් වන අතර ඉතිරි 53% ට විධායක නොවන සහ ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරීන් ඇතුළත් වේ. ආයෝජන මණ්ඩලය තුළ විවිධත්වය දිරිමත් කිරීම මෙන් ම ඒ සඳහා සහයවන අතර එය අපගේ එක් සුවිශාල ශක්තියක් බව විශ්වාස කරන්නෙමු.

ආයෝජන මණ්ඩලයේ සේවය කරන පිරිමි හා කාන්තා සේවකයින්ට සිය වෘත්තීය හරහා ප්‍රගතියක් අතිකර ගැනීම සඳහා එක හා සමාන දිරිමත් කිරීම් සහ අවස්ථාවන් ලබාදේ. අප කණ්ඩායමේ සේවයේ නියුතු වූවන්ගෙන් 34%ක් කාන්තාවන් වන අතර ඉතිරි 66% පිරිමි සේවකයින්ගෙන් සමන්විත වේ. අප කාර්ය මණ්ඩලයේ සියලු කාණ්ඩවල ඔවුන්ගේ නියෝජනය පෙන්නුම් කෙරේ. විධායක කාර්ය මණ්ඩලයේ 48%ක් කාන්තාවන් අතර ඉතිර 52% පිරිමි සේවකයින් වේ. ආයෝජන මණ්ඩලයේ සේවයේ නියුතු කාන්තාවන්ගෙන් සැළකිය යුතු සංඛ්‍යාවක් විශාල වශයෙන් වෘත්තිය ප්‍රගතියක් පෙන්නුම් කරමින් ආයතනයේ ඉහළ කළමනාකරණ තනතුරු දක්වා ගමන් ගන්නා බව නිරන්තරයෙන් නිරීක්ෂණය වේ. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයේ ප්‍රතිඵලයක් ලෙස ආයෝජන මණ්ඩලයේ කාන්තා නිලධාරිනියන් 163දෙනෙක් කණිෂ්ඨ කළමනාකාරිණියන් ලෙස කටයුතු කරන අතර 107 දෙනෙක් මධ්‍යම කළමනාකරණ මට්ටමේ සේවය කරනු ලැබේ. ඔවුන් පිළිවෙළින් 57%ක් හා 44% ක් ලෙස එම කාණ්ඩ දෙක නියෝජනය කරයි. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාණ්ඩයට නිලධාරීන් 78 දෙනෙකු ඇතුළත්වන අතර ඉන් 72%ක් පිරිමි නිලධාරීන්ගෙන්ද 28% ක් කාන්තා නිලධාරීන්ගෙන් ද සමන්විත වේ.




තවද පසුගිය වසර කිපය තුළ උපායමාර්ගික තනතුරුවල කාන්තා නියෝජනයේ සැළකිය යුතු වැඩිවීමක් නිරීක්ෂණය විය. 2020 වනවිට විධායක අධ්‍යක්ෂවරුන්ගේන් හා කලාප ප්‍රධානීන්ගෙන් 23%ක් කාන්තා නිලධාරිනියන් වූ අතර එකී කාණ්ඩයන්හි 77%ක් පිරිමි නිලධාරීන් විසින් නියෝජනය කරනු ලැබීය. ආයතනයේ සියලු මට්ටම්වල ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේ ම සමාන සහභාගිත්වයක් ඉහළ නැංවීමේ අභිමාර්ථයෙන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳව අපි අඛණ්ඩව ක්‍රියාකරන්නෙමු. අපගේ විවිධත්වය ස්ත්‍රී පුරුෂ භාවයෙන් ඔබ්බට එනම් ජනවාර්ගික කණ්ඩායම් සහ සුළු ජාතීන් ඇතුළුව පසුබිම, වයස සහ පළපුරුද්ද යන කරුණු දක්වා පුළුල් වේ. දශක හතරකට වැඩි කාලයක් ව්‍යාපාරයෙහි නියුතු වීමෙන් වසර 05කට වඩා අඩු සිට වසර 20කට වඩා වැඩි පළපුරුද්දක් සහිත සේවක පිරිසක් ආයෝජන මණ්ඩලය සතුවේ. වසර ගණනාවක සිට අප කාර්ය මණ්ඩලය ආයෝජන ප්‍රවර්ධනය, ආයෝජක සේවා සහ වෙනත් අභ්‍යන්තර කාර්යයන් පිළිබඳව විශේෂිත පළපුරුද්දක් ලබා ඇති අතර අපගේ විධායක නිලධාරීන්ගෙන් 60%ක් විවිධ අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි උපාධිධාරීන් වන අතර ඔවුන්ගෙන් 26%ක් පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ඇත. ආයෝජන මණ්ඩලය තුළ උසස් අධ්‍යාපනය සඳහා දිරිමත් කෙරෙන අතර ආයතනයේ සේවකයින්ගේ උසස් අධ්‍යාපනය සඳහා අනුග්‍රහය දැක්වීමට මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්ති සකස්කර ඇත. විශේෂයෙන් ම වේගයෙන් වෙනස්වන, දැඩිලෙස තරගකාරී මෙම කාර්යයේ දී අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය ඉතා වැදගත් බව අප විශ්වාස කරන්නෙමු.

## අපගේ අනාගතය - වෙනස් වූ කාර්යභාරයක්

ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ඇතිවී තිබෙන ස්ථිර වෙනස්කම් අනුව, කාර්ය මණ්ඩල කළමනාකරණයේදී ආයෝජන මණ්ඩලයට සිය කාර්යභාරය පිළිබඳව වෙනස් ආකාරයක දැක්මක් ඇත. "නව සාමාන්‍යකරණය" සමග මූලික වශයෙන් වෙනස් වූ වසංගතයේ පැතිරීම නොවූයේ නම් අප විසින් මෙම කාර්යභාරය අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ඇත. මේ වනවිටත් පවතින වසංගතය හරහා ආයතනයේ කාර්යයන් සිදුකරනු ලබන සේවකයින් සඳහා දිගටම සහයවීම ආයෝජන මණ්ඩලයේ අපේක්ෂාව වේ. වසංගත කාලය තුළදී මහජන සේවය පිළිබඳව ප්‍රභල හැඟීම පෙන්නුම් කළ සේවයට කැප වූ කණ්ඩායම සමගින් රට අපෙන් බලාපොරොත්තුවන දේ ළඟාකර ගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කරන්නෙමු. නව සාමාන්‍යකරණය තත්වය යටතේ සියලු කරුණුවලට අනුගතව ආයෝජන මණ්ඩලය අඛණ්ඩව ඔවුන් සවිබල ගැන්වීම සහ සහය දීම සිදු කෙරේ.

තවද, වඩාත් වේගවත් සහ නම්‍යශිලී කාර්ය පිළිවෙත් වැඩිදියුණු කිරීම මගින් දැනට සිදුකරගෙන යන ක්‍රියාකාරකම් සඳහා වෙනස් වූ බලපෑමක් ඇති කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු. අප විසින් සපයනු ලබන සේවාවන්හි කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය වැඩිකිරීම සඳහා අපගේ  හැකියාවන් ගොඩනගා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීමට අපේක්ෂා කරන්නෙමු. වසංගත කාලය තුළ ලොවපුරා දිරිමත් වූ තාක්ෂණික නවෝත්පාදන මගින් සැලකිය යුතු අභියෝගයන් ද සමගින් අපට අවස්ථා ගණනාවක් උදාකර දී ඇත. වෙනස් වූ වාතාවරණය යටතේ වෙනස ධනාත්මකව භාරගැනීමට සහ රටට ඉහළම ප්‍රතිලාභ ලබාගැනීම සඳහා අප කාර්ය මණ්ඩලයට සහයදීම, බලගැන්වීම හා පහසුකම් සැලසීමට ආයතනයක් වශයෙන් ආයෝජන මණ්ඩලය බලාපොරොත්තු වේ. එබැවින් අපට වෙනස් වූ කාර්යභාරයක් ඇත.

# ආයතනික සමාජ වගකීම

සන්නාමයේ ප්‍රතිරූපය වැඩිදියුණු කරමින් සමාජීය හා පාරිසරික ගැටලු පිළිබඳව මහජනයාගේ දැනුවත්භාවය ඇතිකරමින් මනා අචාරධර්මයන්ට හා තිරසාර සංවර්ධන ඉලක්කයන්ට සමාජීය වශයෙන් වගකිවයුතු අයුරින් ව්‍යාපාරයක් පවත්වා ගන්නා ආකාරය ආයතනික සමාජ වගකීම් මගින් පෙන්නුම් කෙරේ.

ආයතනික සමාජ වගකීම් පිළිබඳ ක්‍රියාකාරකම්හි නියැලීම සඳහා සිය සමාගම් දිරිමත් කරන අතර ම ආයෝජන මණ්ඩලය විසින් පරිසර සංරක්ෂණය විවිධාංගිකරණය හා කම්කරු ක්‍රියාපිළිවෙත් සහ ස්වේච්ඡා සේවයන්හි යෙදීම වැනි විවිධ ආයතනික සමාජ වගකීම්වල නිරත වේ.

❖ **නිෂ්පාදනයන්හි නිරත ව්‍යවසායයන් මුහුණපාන ගැටළුවක් වන කම්කරු හිඟය අවම කිරීම සඳහා ගනු ලැබූ මූලික ක්‍රියාමාර්ග**

ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ කම්කරු හිඟයට පිළියමක් වශයෙන් ආයෝජන මණ්ඩලය විසින් ආරම්භ කරන ලද කාර්යයන්;

- **සේවකයින්ගේ සේවා ඒකක (ESUs)**

  රැකියා අපේක්ෂකයින් සහ පුරප්පාඩු ඇති ව්‍යාසායයන්හි කළමනාකරණ නියෝජිතයින් එකිනෙකා මුණ ගැස්වීම සඳහා සෑම කලාපයක ම සේවකයින්ගේ සේවා ඒකක ඇති කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදුකෙරේ. පළමු COVID-19 රැල්ලෙන් පසුව වසංගතය අඩු වූ විට 2020 සැප්තැම්බර් මාසයේදී සිය මෙහෙයුම් ආරම්භ කරන ලදී.

- **දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා පෙර පාසල් ස්ථාපනය කිරීම**

  අපනයන සැකසුම් කලාපයන්හි දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා පෙර පාසල් පිහිටුවීම මගින් කලාපය තුළ ආරක්ෂිත ස්ථානයක තම දරුවන් තබාගනිමින් සිය රැකියාවන්හි නිරතවීමට කැමති සේවකයින් සඳහා විසඳුමක් ලබාදේ. මෙමගින් රැකියා හැරයාම අඩු වී ඇති අතර අළුතින් සේවයට එක්වන අය අතර කලාප පිළිබඳ ආකර්ෂණීය හැඟීමක් ඇතිකිරීමට ඉවහල් වී ඇත. කටුනායක බියගම සහ මල්වත්ත අපනයන සැකසුම් කලාපයන්හි ඇති දිවා සුරැකුම් මධ්‍යස්ථාන 2020 වසරේ සැප්තැම්බර් මස සිට සේවාවන් ආරම්භ කර ඇත.

  මෙම දුෂ්කර කාලසීමාව තුළ වඩාත් ඵලදායී ලෙස සමාජයට සිය ආයතනික වගකීම් ඉටුකිරීමේ අවශ්‍යතාවය ඇතිවිය. COVID-19, ආයතනික අංශයේ ත්‍යාගශීලීත්වය සඳහා වේදිකාවක් සැපයීය.

  වසංගත කාලයේදී සමාගම් ගණනාවක්ම සිය සේවකයින්ට මෙන්ම COVID-19 එරෙහි ඉදිරි පෙළ සටන්කරන අයගේ ජීවිත නඟාසිටුවීම සඳහා තම නිෂ්පාදන හා සේවාවන් පිරිනමනු ලැබීය. ආයෝජන මණ්ඩලයීය සමාගම් ත්‍රිවිධ හමුදාවට හා සෞඛ්‍ය බලධාරීන්ට පුද්ගල ආරක්ෂක උපකරණ ලබාදෙනු ලැබීය. ව්‍යවසායයන් බොහොමයක්ම වියළි සලාක ලබාදීම සහ කුලියට ගත් හෝටලයන්හි නවාතැන් පහසුකම් සැපයීම ආදීය මගින් සිය සේවකයින්ට මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආරක්ෂාකර ගැනීම සඳහා කටයුතු කරන ලදී. සමහර ව්‍යවසායයන් රටවසා දැමූ කාලය තුළ සිය සේවකයින් සඳහා සම්පූර්ණ වැටුප ම ගෙවනු ලැබීය. ව්‍යවසායයන් බොහොමයක්ම සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව සිය සේවකයින් සඳහා අතිරේක ප්‍රවාහන පහසුකම් සැපයීම, විෂබීජහරණය කිරීම හා පුද්ගල ආරක්ෂක උපකරණ සඳහා විශාල වියදමක් දරා ඇත. තවද මෙම ව්‍යවසායයන් සෞඛ්‍යය අමාත්‍යාංශය විසින් නිකුත්කරන ලද මාර්ගෝපදේශයන්ට අනුව සිය සේවකයින්ගේ පීසීආර්/ක්ෂණික ප්‍රතිදේහ පරීක්ෂණ සිදුකිරීම සඳහා මේවන විට ද විශාල වියදමක් දරයි.

# 2020 වසරේ මූල්‍ය සමාලෝචනය

## වැදගත් මූල්‍යමය තොරතුරු

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා වැදගත් මූල්‍යමය තොරතුරු | 2020 (රු. මිලි) | 2019 (රු. මිලි) | වෙනස (%) | 2018 (රු. මිලි) |
|---|---|---|---|---|
| ආදායම | 4,251 | 4,646 | (8.50) | 3,890 |
| මුළු මෙහෙයුම් වියදම් | (3,591) | (3,773) | 4.84 | (3,375) |
| මෙහෙයුම් ලාභය | 660 | 873 | (24.33) | 515 |
| මූල්‍ය ආදායම | 322 | 411 | (21.84) | 344 |
| මූල්‍ය වියදම් | (14) | (11) | (30.17) | (8) |
| බදුකරණයට පෙර අතිරික්තය | 968 | 1,274 | (23.98) | 851 |
| බදු වියදම් | (81) | (115) | 29.48 | (92) |
| බදුකරණයට පසු අතිරික්තය | 887 | 1,158 | (23.43) | 759 |
| වෙනත් විස්තීර්ණ ආදායම | (75) | (51) | (46.37) | (11) |
| මුළු විස්තීර්ණ ආදායම | 812 | 1,107 | (26.68) | 748 |
| වසර අවසානයේ මූල්‍යමය තත්වය | | | | |
| මුළු වත්කම් | 53,127 | 44,158 | 20.31 | 43,269 |
| මුළු සම කොටස් | 51,868 | 42,685 | 21.51 | 41,631 |









## අතිරික්තය

බදුකරණයට පෙර සියලු දන්නා වගකීම් සහ දේපළ, පිරියත හා උපකරණ මත ක්ෂයකිරීම් සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසු ආයෝජන මණ්ඩලය විසින් ලබාගත් අතිරික්තය රු.මිලියන 968.14ක් වේ. බදුකරණය ලෙස රු.මිලියන 81.25ක ප්‍රමාණයක් අඩු කිරීමෙන් පසු කාලසීමාව සඳහා වන අතිරික්තය රු.මිලියන 886.89ක් විය. 2019 වසරේ වාර්තා වූ රු.මිලියන 1,158.31ක අගය හා සැසඳීමේ දී 2020 වසරේ මණ්ඩලයේ බදු පසු අතිරික්තය 23.43%කින් අඩුවී ඇත. 2020 වසරේදී COVID-19 ව්‍යාප්තිය සමග ආර්ථික වර්ධනයේ අඩුවීමක් සිදු වූ අතර ආදායම් ඉපයීමේ වේගය අඩුවීම ආයෝජන මණ්ඩලයේ ශුද්ධ අතිරික්තය අඩුවීමට විශාල ලෙස බලපාන ලදී.







## ආදායම

ආයෝජන මණ්ඩලයේ මෙහෙයුම් ආදායම 2019 වසරේ සිට 2020 වසර දක්වා රු.මිලියන 4,646.09 සිට රු.මිලියන 4,251.30 දක්වා 8.50%කින් අඩුවී ඇත. COVID-19 වසංගතයේ ව්‍යාප්තියත් සමග ආනයන/අපනයන සේවා ගාස්තු, ශුද්ධ ජල ආදායම, විකුණුම් හා ප්‍රවේශ අවසරපත් සහ ගිවිසුම් සකස් කිරීමේ ගාස්තුවල අඩුවීම මෙහෙයුම් ආදායමේ අඩුවීමට ප්‍රධාන වශයෙන්ම දායක වී ඇත. මණ්ඩලය විසින් උපයන ලද පොළී ආදායම ද 2019 වසරේ සිට 2020 වසර දක්වා රු.මිලියන 411.44 සිට රු.මිලියන 321.58 දක්වා 21.84%කින් අඩු වී ඇත. පොළී අනුපාත අඩුවීම මෙයට ප්‍රධාන හේතුව වේ.




2019 වසරේ සිට 2020 වසර දක්වා ආයෝජන මණ්ඩලයේ සමස්ත අදායම රු.මිලියන 5.057.53 සිට රු.මිලියන 4,572.88 දක්වා අඩු වී ඇත.




## මෙහෙයුම් වියදම්

2019 වසර මෙහෙයුම් වියදම් රු.මිලියන 3,590.87ක් වූ අතර එය පෙර වසර හා සන්සන්දනය කිරීමේදී 4.84%ක අඩුවීමකි. COVID-19 වසංගතයේ ව්‍යාප්තිය මණ්ඩලයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් මන්දගාමී වීමට හේතුවිය. මෙමගින් මූලික වශයෙන්ම අඩු ආදායම් වර්ධනයක් සහිත වියදම් රටාවකට හේතුවිය. ප්‍රධාන වශයෙන් ම මෙහෙයුම් පිරිවැයෙහි දැඩි පිරිවැය පාලන ක්‍රියාමාර්ග ආසන්න වශයෙන් රු.මිලියන 182.50ක ඉතිරියක් සඳහා දායක විය. සමාලෝචනයට ලක් වූ කාලසීමාවේ දී ආදායම සීඝ්‍රයෙන් පහත වැටුණ ද ආයෝජන මණ්ඩලය විසින් අනුගත කරගනු ලැබූ මෙම පිරිවැය පාලන ක්‍රියාමාර්ග ශුද්ධ අතිරික්තයේ ධන අගයක් අත්කරගැනීමට සෘජුවම දායක වී ඇත.



## බදු සඳහා දායකත්වය

වසර තුළ සෘජු හා වක්‍ර බදු 54.01%කින් අඩුවිය. 2020 වසරේදී බදු නීතියට සිදුකරන ලද වෙනස්කම් මේ සඳහා මූලික වශයෙන් හේතු විය. සෘජු හා වක්‍ර බදු ලෙස වසර සඳහා ආයෝජන මණ්ඩලයේ දායකත්වය රු.මිලියන 170.04ක් ලෙස පසුගිය වසර හා සන්සන්දනය කිරීමේ දී අඩු ප්‍රවණතාවක් පෙන්නුම්කර ඇත. වියදමක් ලෙස හඳුනාගනු ලැබූ ලබා නොදෙන එකතු කළ අගය මත බදු (VAT) යෙදවුම් රු.මිලියන 112.34කින් පහත වැටීමත් සමග 56.02%කින් අඩු වී ඇත. ආයෝජන මණ්ඩලයේ මුළු සෘජු බදු ප්‍රමාණය පොළී ආදායම මත බදුවලින් සමන්විත වේ.

# 2020

# මූල්‍ය ප්‍රකාශන

## (2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා)

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා | සටහන | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| ආදායම | **4** | **4,251,299,069** | **4,646,091,668** |
| **අඩුකලා : වියදම්** | | | |
| මෙහෙයුම් වියදම් | **6** | 273,552,379 | 322,000,511 |
| පරිපාලන වියදම් | **7** | 3,192,487,029 | 3,165,507,062 |
| රජයේ තීරුබදු | **8** | 88,787,598 | 254,568,577 |
| වෙනත් වියදම් | **9** | 36,038,612 | 31,290,988 |
| **සම්පූර්ණ මෙහෙයුම් වියදම්** | | 3,590,865,618 | 3,773,367,139 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය** | | **660,433,451** | **872,724,528** |
| මූල්‍ය ආදායම | | 321,579,138 | 411,444,914 |
| මූල්‍ය වියදම් | | 13,873,362 | 10,657,560 |
| **ශුද්ධ මූල්‍ය ආදායම** | **10** | **307,705,775** | **400,787,354** |
| **බදුකරණයට පෙර අතිරික්තය** | | **968,139,227** | **1,273,511,883** |
| බදු වියදම් | | 81,246,467 | 115,204,576 |
| **කාලසීමාව සඳහා අතිරික්තය** | | **886,892,760** | **1,158,307,307** |

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

### විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | සටහන | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| **කාලසීමාව සඳහා අතිරික්තය** | | **886,892,760** | **1,158,307,307** |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | |
| **අඩුකලා : නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ආයුගණක (ලාභ)/පාඩු** | **21.1** | 75,380,123 | 51,499,585 |
| **කාලසීමාව සඳහා විස්තීරණ ආදායමේ එකතුව** | | **811,512,637** | **1,106,807,722** |

පිටු අංක 46 සිට 66 දක්වා වන "මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්" මූල්‍ය ප්‍රකාශන වල සංගෘහිත කොටසකි.

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## මූල්‍ය තත්ව ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2020 | 2019 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 11 | 6,159,405,466 | 5,310,547,630 |
| ආයෝජන දේපල | 12 | 38,854,205,189 | 31,073,365,587 |
| සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් | 13 | 1,463,837,429 | 1,982,355,530 |
| මූල්‍යමය වත්කම් | 14 | 643,278,444 | 654,403,425 |
| **ජංගම නොවන වත්කම් එකතුව** | | **47,120,726,528** | **39,020,672,172** |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ වට්ටෝරු | | 13,860,225 | 10,272,093 |
| අපහරණය සඳහා වන නිවාස | | 2,551,000 | 2,551,000 |
| මූල්‍ය වත්කම් | 15 | 216,873,965 | 206,479,430 |
| ව්‍යවසායයන්ගෙන් ලැබීම් | 16 | 480,733,989 | 315,491,118 |
| අත්තිකාරම් ගෙවීම් හා වෙනත් ලැබිය යුතු දෑ | 17 | 546,747,679 | 264,288,415 |
| මුදල් හා මුදලට සමාන දෑ | 18 | 4,745,108,178 | 4,338,222,775 |
| **ජංගම වත්කම් එකතුව** | | **6,005,875,037** | **5,137,304,831** |
| **වත්කම් එකතුව** | | **53,126,601,565** | **44,157,977,003** |
| **සම කොටස් හා වගකීම්** | | | |
| සම කොටස් | | | |
| සමුච්චිත අරමුදල | | 20,911,194,024 | 11,845,461,590 |
| සංචිත | | 15,340,693,234 | 15,340,693,234 |
| | | **36,251,887,258** | **27,186,154,824** |
| විලම්භිත ආදායම | 20 | 16,007,082,111 | 15,915,950,349 |
| විලම්භිත වියදම් | 19 | (390,763,524) | (417,422,964) |
| | | **15,616,318,587** | **15,498,527,385** |
| **සම කොටස් එකතුව** | | **51,868,205,846** | **42,684,682,209** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 21 | 370,952,018 | 329,992,061 |
| ජංගම නොවන මූල්‍යමය වගකීම් | 22 | 58,969,208 | 74,875,711 |
| **ජංගම නොවන වගකීම් එකතුව** | | **429,921,226** | **404,867,772** |
| **ජංගම වගකීම්** | | | |
| ජංගම මූල්‍යමය වගකීම් | 22 | 29,673,285 | 26,977,500 |
| සමුච්චිත වියදම් හා වෙනත්ගෙවිය යුතු දෑ | 23 | 787,247,092 | 1,018,683,817 |
| ගෙවිය යුතු බදු | | 11,554,115 | 22,765,703 |
| **ජංගම වගකීම් එකතුව** | | **828,474,492** | **1,068,427,020** |
| **සම කොටස් හා වගකීම් එකතුව** | | **53,126,601,565** | **44,157,977,003** |

පිටු අංක 46 සිට 66 දක්වා වන "මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්" මූල්‍ය ප්‍රකාශන වල සංගෘහිත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුවේ
ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කරීම හා අත්සන් කිරීම කරනු ලබන්නේ,

| | | | |
|---|---|---|---|
| සංජය මොහොට්ටාල මයා | සංජේ කුලතුංග මයා | පී.ටී.වනිගසේකර මයා | එස්.ඒ.ඩී.ඩී.සුරවීර මිය |
| **සභාපති** | **අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික** | **අධ්‍යක්ෂ ජනරාල්** | **විධායක අධ්‍යක්ෂ - මුදල්** |

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

**සම කොටස් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය**

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා**

| | සමුච්චිත අරමුදල<br>රු. | ප්‍රත්‍යාගණන සංචිත<br>රු. | සම කොටස් වල එකතුව<br>රු. |
|---|---|---|---|
| **2019 ජනවාරි 01 දිනට ශේෂය** | **10,953,811,118** | **15,340,693,234** | **26,294,504,352** |
| වසර සඳහා විස්තීර්ණ ආදායමේ එකතුව | 1,106,807,722 | - | 1,106,807,722 |
| වත්කම් හඳුනාගැනීම | 248,192 | - | 248,192 |
| ආදායම වෙනස්වීම් කෙරෙහි බලපෑම - 2018 | (439,787) | - | (439,787) |
| සම කොටස් වලින් සෘජුවම අඩුකරනලද ලැබියයුතු දෑ ගැලපීම් කෙරෙහි බලපෑම - ශ්‍රී ලංකා කජු සංස්ථාව | (209,600,000) | - | (209,600,000) |
| සම කොටස්වල සෘජුවම හඳුනාගනු ලැබූ භාණ්ඩාගාරය සඳහා ගනුදෙනු | (5,365,655) | - | (5,365,655) |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **11,845,461,590** | **15,340,693,234** | **27,186,154,824** |
| | | | |
| **2020 ජනවාරි 01 දිනට ශේෂය** | **11,845,461,590** | **15,340,693,234** | **27,186,154,824** |
| වසර සඳහා විස්තීර්ණ ආදායමේ එකතුව | 811,512,637 | | 811,512,637 |
| ඒකාබද්ධ අරමුදල සඳහා දායකත්වය | (155,535,700) | | (155,535,700) |
| තාවකාලික අතිරික්ත අරමුදලේ ශේෂය | (3,921,984) | | (3,921,984) |
| ඉඩම පවරා ගැනීම හේතුවෙන් ලැබියයුතු දෑ නැවත ප්‍රකාශකිරීමේ බලපෑම - ශ්‍රී ලංකා කජු සංස්ථාව [1] | 423,360,000 | | 423,360,000 |
| සම කොටස් හරහා සෘජුවම හඳුනාගනු ලැබූ භාණ්ඩාගාරය සඳහා ගනුදෙනු [2] | 134,432 | | 134,432 |
| රජයේ හිමිකාරීත්වය හරහා නව ඉඩම්වල වටිනාකම හඳුනාගැනීම (පෙරනියල් රියල් එස්ටේට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සහ වේකන්ට් ලෑන්ඩ්) [3] | 7,972,383,349 | | 7,972,383,349 |
| සම කොටස් හරහා සෘජුවම හඳුනාගත් රජයට පවරාගත් ඉඩම් [4] | (1,615,000) | | (1,615,000) |
| කොග්ගල අපනයන සැකසුම් කලාපයේ (KGEPZ) ඇති වත්කම් හඳුනාගැනීම [5] | 1,879,000 | | 1,879,000 |
| සමකොටස් හරහා සෘජුවම හඳුනාගත්, රජය වෙනුවෙන් ඉඩම සඳහා ගෙවනලද අත්තිකාරම ආපසු අයකර ගැනීම [6] | (51,500,000) | | (51,500,000) |
| රජයේ ප්‍රදානය - සමකොටස් හරහා සෘජුවම හඳුගත් ඉඩම - බිං.අ.සැ.ක (BGEPZ) [7] | 112,000,000 | | 112,000,000 |
| සමකොටස් හරහා සෘජුවම හඳුනාගත් බදුකුලී ආපසු අයකරගැනීම කෙරෙහි බලපෑම [8] | (42,964,300) | | (42,964,300) |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **20,911,194,024** | **15,340,693,234** | **36,251,887,258** |

1. 2019 වසරේ විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති නිරීක්ෂණ පදනම් කරගෙන කජු සංස්ථා ඉඩම නමින් හැඳින්වෙන කොළඹ 03 පිහිටි ඉඩම සඳහා ලැබිය යුතුව තිබූ රු.209,600,000.00ක මුදලක් සමකොටස් හරහා කපාහැර තිබේ. මෙම ඉඩම 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත යටතේ රජයට පවරාගනු ලැබූ අතර නාගරික සංවර්ධන අධිකාරියට පවරාදෙනු ලැබීය. නාගරික සංවර්ධන අධිකාරිය දැන් රජයේ තක්සේරු කිරීම පදනම් කරගෙන රු. 423,360,000.00ක් වන වන්දි මුදලක් ගෙවීමට එකඟවී ඇත. මෙය රජයේ හිමිකාරිත්වය හරහා නැවත ප්‍රකාශකර ඇත.

2. සමකොටස් හරහා සෘජුවම හඳුනාගත් භාණ්ඩාගාරය සඳහා ගනුදෙනු

   2.1 විශාල ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සැලසීම වෙනුවෙන් දරන ලද වියදම් සමකොටස් ගිණුම හරහා සෘජුවම හඳුනාගෙන ඇත. (රු.50,000.00)

   2.2 සමකොටස් වල හඳුනාගත් භාණ්ඩාගාරය සඳහා ගනුදෙනු ආපසු ගෙවීම රු.184,432.00 කි

3. මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් කොළඹ බාලදක්ෂ මාවතේ පිහිටා ඇති අක්කර 3 රූඩ් 3 පර්චස් 5ක වපසරියකින් යුත් ඉඩමක් ආයෝජන මණ්ඩලයට පවරාදී ඇත. මෙය රජයේ සමකොටස් හරහා සෘජුවම හඳුනාගෙන ඇත.

4. 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත යටතේ රජයට පවරාගත් ඉඩම් රජයේ හිමිකාරිත්වය හරහා සෘජුවම හඳුනාගෙන ඇත.

5. ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත්කර නොමැති වත්කම් සෘජුව හඳුනාගැනීම. රජයේ තක්සේරුකිරීම පදනම් කරගෙන ගොඩනැගිල්ලේ වටිනාකම යාවත්කාලීනකර තිබේ.

6. බිංගිරියේ පිහිටා ඇති ඉඩමක් අත්පත්කර ගැනීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් රජය වෙනුවෙන් කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අත්තිකාරමක් ගෙවා තිබුණි. 2020 වසරේ ඒකාබද්ධ අරමුදලට දායකත්වය මගින් මෙම මුදල අයකරගෙන ඇත.

7. ශ්‍රී ලංකා රජය විසින් අපනයන සැකසුම් කලාපයක් ස්ථාපනය කිරීම සඳහා බිංගිරියේ පිහිටා ඇති අක්කර 439 රූඩ් 6 පර්චස් 12.67ක වපසරියකින් යුත් ඉඩමක් පවරාදී ඇත. මෙම ඉඩමේ වටිනාකම රජයේ හිමිකාරිත්වය හරහා රජයේ ප්‍රදානයක් ලෙස සෘජුවම හඳුනාගෙන ඇත.

8. කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සහ සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය මගින් ලැබියයුතු කල් ඉක්මුණු බදුකුලිය රජයේ හිමිකාරිත්වයෙන් සෘජුවම අඩුකර ඇත. ආයෝජන මණ්ඩලය විසින් 25 සහ 27වන මහල් රේඛීය අමාත්‍යාංශය සඳහා බදුදී තිබුණි.

**පිටු අංක 46 සිට 66 දක්වා වන "මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්" මූල්‍ය ප්‍රකාශන වල සංගෘහිත කොටසකි.**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා | 2020 රු. (මිලි) | 2019 රු. (මිලි) |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ** | | |
| **මෙහෙයුම් මගින් උත්පාදනය වු මුදල් (24 සටහන)** | **625.78** | **924.84** |
| ආදායම් බදු ගෙවීම් | (92.46) | (121.65) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් ගෙවීම | (75.57) | (37.94) |
| විශ්‍රාම ප්‍රතිලාභ නැවත ගැලපීම | - | 1.27 |
| ලැබූ විලම්භිත ආදායම | 300.90 | 408.75 |
| ලැබූ ඉඩම් වෙන්කිරීම් | 31.21 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මුල්‍ය ඇතුලට ගැලීම්/පිටතට ගැලීම්** | **789.86** | **1,175.27** |
| **ආයෝජන ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ** | | |
| ලැබූ ආයෝජන ආදායම | 347.97 | 411.13 |
| කායර් මණ්ඩල ණය හා මුල්‍ය සහය | 11.12 | (43.08) |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | (45.92) | (153.55) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල් | 19.06 | 18.94 |
| සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කායර්යන් | (570.60) | (791.58) |
| විලම්භිත වියදම් | (3.03) | (0.31) |
| **අයෝජන ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මුල්‍ය ඇතුලට ගැලීම්/(පිටතට ගැලීම්)** | **(241.39)** | **(558.45)** |
| **මුල්‍යයන ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ** | | |
| ගෙවූ කල්බදු වාරික | (42.26) | (29.45) |
| භාණ්ඩාගාරය වෙත අරමුදල් මාරුකිරීම් | (159.46) | - |
| රදා ඇළ හොරණ අ.සැ.ක. සඳහා ආපසු ගෙවීම් | 0.18 | - |
| මැනුම් ගාස්තු අත්තිකාරම් | (0.05) | - |
| කජු සංස්ථාවට වන්දි ගෙවීම | 60.00 | - |
| **මූල්‍යන ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මුල්‍ය ඇතුලට ගැලීම්/(පිටතට ගැලීම්)** | **(141.58)** | **(29.45)** |
| මුදල් හා මුදලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | 406.89 | 587.37 |
| වසර ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ | 4,338.22 | 3,750.85 |
| වසර අවසානයේ මුදල් හා මුදලට සමාන දෑ | **4,745.11** | **4,338.22** |

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### 1. වාර්තා කරනු ලබන ආයතනය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, 1978 අංක 4 දරණ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතිය යටතේ ස්ථාපනය කරනු ලැබීය. එහි ලියාපදිංචි කාර්යාලය හා ප්‍රධාන කාර්යාලය බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, එචෙලොන් චතුරශ්‍රය, කොළඹ 01 යන ස්ථානයේ පිහිටා තිබේ.

### 2. පිළියෙල කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය තත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, සම කොටස් වෙනස්වීම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් හා සටහන් සමග මණ්ඩලයේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති, ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තා කිරීමේ ප්‍රමිති නියෝජනය කරන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS) අනුකූලව පිළියෙල කර ඇත.

### 2.2 ඇස්තමේන්තු, විනිශ්චයන්, හා උපකල්පනයන් භාවිතා කිරීම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණයට, ආදායම්, වියදම්, වත්කම් හා වගකීම්වල වාර්තාගත ප්‍රමාණයන් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන සිදුකිරීම හා වාර්තා කරන දිනට අවිනිශ්චිත වගකීම් අනාවරණය කිරීම අවශ්‍ය කෙරේ. ඇස්තමේන්තු හා මූලික උපකල්පන සිදුකෙරෙමින් පවතින පදනම මත සමාලෝචනය කෙරේ. නමුත් මෙම උපකල්පන හා ඇස්තමේන්තුවල අවිනිශ්චිතභාවය මගින් අනාගතයේදී වත්කම් හෝ වගකීම්වල ඉදිරියට ගෙන එන අගයට බලපාන ප්‍රමාණාත්මක ගැලපීම් අවශ්‍ය වියහැකි ප්‍රතිඵල ඇතිකළ හැකි වේ.

### 2.3 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් මණ්ඩලයේ අඛණ්ඩව ඉදිරියට පැවතීමේ හැකියාව තක්සේරුකර ඇත. මණ්ඩලයට පුරෝකථනය කල හැකි අනාගතයක් සඳහා අඛණ්ඩව මෙහෙයවීම සඳහා අවශ්‍ය පමණ සම්පත් ඇති බවට සාධාරණ අපේක්ෂාවක් ඇත. මණ්ඩලයේ අනාගතය පිළිබඳ පවතින සියළු තොරතුරු සැලකීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇවර කිරීම හෝ මෙහෙයුම් අවසාන කිරීමේ අවශ්‍යතාවයක් නිරීක්ෂණය කර නොමැත. ඒ අනුව, මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඉදිරි අඛණ්ඩ පැවැත්ම පදනම අනුගත කරගෙන ඇත.

### 2.4 ව්‍යවහාර හා ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

මණ්ඩලයේ ව්‍යවහාර කරනු ලබන මුදල් ඒකකය වන්නේ ශ්‍රී ලංකා රුපියල් වන අතර මූල්‍ය ප්‍රකාශන ද ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.1 මූල්‍ය වත්කම්

මණ්ඩලය මගින් එහි මූල්‍ය වත්කම් ණය හා ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කරනු ලබන අතර මූල්‍ය වත්කම් ආයෝජනය කිරීමේ සාධාරණ අගයට මනිනු ලැබේ. මූලික හඳුනා ගැනීමේදීම කළමනාකරණය විසින් වර්ගීකරණය තීරණය කරනු ලබන අතර ආයෝජනය කරන හා අත්පත් කරගනු ලබන අරමුණ මත රඳා පවතී.

**(අ) වර්ගීකරණය.**

(i) *ණය හා ලැබිය යුතු දෑ*

ණය හා ලැබිය යුතු දෑ යනු ක්‍රියාකාරී වෙළඳපලෙහි මිළ ගණන් දක්වා නොමැති ස්ථාවර හෝ තීරණය කල හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. සාමාන්‍ය ගනුදෙනු මගින් ජනිත වන ලැබිය යුතු දෑ ද මෙම කාණ්ඩය යටතේ වර්ගීකරණය කරනු ලබන අතර හානිකරණය සඳහා සමාලෝචනය කෙරේ.

(ii) *සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම් - (කල්පිරෙන තෙක් තබාගනු ලබන මූල්‍ය වත්කම්)*

ස්ථාවර හෝ තීරණය කළහැකි ගෙවීම් හා ස්ථාවර කල්පිරීමක් සහිත මණ්ඩලයේ කළමනාකාරිත්වයට ධනාත්මක ආකල්පයක් හා කල්පිරීම සඳහා රඳවා තැබීමේ හැකියාව ඇති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් කල්පිරෙන තෙක් තබාගනු ලබන මූල්‍ය වත්කම් වේ. මෙම මූල්‍ය වත්කම් හඳුනාගෙන ආදායම් ප්‍රකාශයේ සාධාරණ අගයට වර්ගීකරණය කරනු ලැබේ.

**(ආ) හානිකරණය**

හානිකරණය පිළිබඳ යම් සඳහන් කිරීමක් තිබේ දැයි තීරණය කිරිම සඳහා මූල්‍ය වත්කම් එක් එක් මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනය අනුව සමාලෝචනය කෙරේ. එවැනි සඳහන් කිරීමක් වේනම් වත්කමෙහි නැවත ලබාගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තුගත කෙරේ.

වත්කමක ඉදිරියට ගෙනයන ප්‍රමාණය හෝ එහි මූල්‍ය උත්පාදන ඒකක එහි ආපසු ලබාගැනීමේ ප්‍රමාණය ඉක්මවා යනවිට හානිකරණ පාඩුව හඳුනා ගැනේ. හානිකරණ පාඩුව ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

**(ඇ) වත්කම් හා බැරකම් ශේෂ පත්‍රයෙන් ඉවත් කිරිම.**

පූර්ව කාලීනව හඳුනාගනු ලැබූ හානිකරණ පාඩු, ඒවා අඩුවී තිබේද හෝ තවදුරටත් පවතින්නේ දැයි යම්කිසි සඳහන් කිරීමක් සඳහා එක් එක් වාර්තාකරණ දිනයට තක්සේරු කරනු ලැබේ. ආපසු ලබාගත හැකි ප්‍රමාණය තීරණය කිරිම සඳහා භාවිතා කළ ඇස්තමේන්තුවල වෙනසක් වී ඇතිනම් හානිකරණ පාඩු ශේෂ පත්‍රයෙන් ඉවත් කරනු ලැබේ.

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

### 3.2 දේපළ, පිරියත හා උපකරණ

#### (අ) හඳුනාගැනීම සහ මැනීම

දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයකිරීම හා යම් සමුච්චිත හානිකරණ පාඩු අඩුකර පිරිවැයට දක්වනු ලැබේ. වත්කම අත්පත්කර ගැනීම සඳහා සෘජුවම දායකවන වියදම් පිරිවැයට අතුලත්වේ. ආයතනය විසින් ඉදිකරනලද වත්කම්වල පිරිවැයට ද්‍රව්‍ය සඳහා වන පිරිවැය, කම්කරු ශ්‍රමය. වත්කම එමගින් අපේක්ෂිත භාවිතය සඳහා කාර්ය තත්වයට ගෙනඒමට සෘජුවට දායකවන වෙනත් යම් පිරිවැය, අයිතමය කොටස්කිරීම හා ඉවත්කිරීමේ පිරිවැය සහ ඒවා පිහිටි ස්ථානයේ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වන පිරිවැය ඇතුලත්වේ.

ප්‍රත්‍යාගණන වත්කම් සඳහාවන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 (SLFRS 1) අනුව, දේපළ පිරියත හා උපකරණවල අගය තක්සේරු කිරීමේදී 2011 ජනවාරි 01 දිනට සමුච්චිත ක්ෂයවීම් අඩුකර 2011 ජනවාරි 01 දිනට ඇති පිරිවැය ලෙස සලකා බලනු ලැබේ.

#### (ආ) ක්ෂය කිරීම

දේපළ, පිරියත හා උපකරණයන්හි සියලු අයිතමයන් පිරිවැය/තක්සේරුව අනුව සෘජු රේඛා පදනම මත ක්ෂය කිරීම ගණනය කරනු ලබන අතර එය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. ස්ථාවර වත්කම් භාවිතයට ගතහැකි විට ඒවා මිලටගත් වර්ෂයේදී ඒ මත ක්ෂය කිරීම් අයකරනු ලැබේ. දේපළ පිරියත හා උපකරණ ඒවායේ ප්‍රයෝජනවත් ආයු කාලය අනුව වාර්ෂිකව ක්ෂය කර ඇත. සින්නක්කර ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

| වත්කම් කාණ්ඩය | වසරක් සඳහා ක්ෂය කිරීමේ ප්‍රතිශතය | කාල සීමාව (වසර) |
|---|---|---|
| ගොඩනැගිලි හා ව්‍යුහයන් | 5 | 20 |
| පිරියත හා යන්ත්‍ර | 10 | 10 |
| සවිකුරු හා උපාංග | 10 | 10 |
| කාර්යාලීය ලී බඩු හා උපකරණ | 10 | 10 |
| පරිගණක | 33.33 | 3 |
| මෝටර් රථ | 20 | 5 |

#### (ඇ) හඳුනාගනු ලැබූ මූල්‍ය වත්කමක් හෝ වගකීමක් ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම

දේපළ හා උපකරණ අයිතම අපහරණය කිරීම මත හෝ ඒවා භාවිතයෙන් අනාගත ප්‍රතිලාභ බලාපොරොත්තු නොවන විට ශේෂ පත්‍රයෙන් ඉවත් කරනු ලැබේ. එසේ දේපළ, පිරියත හා උපකරණ අයිතම ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම නිසා ඇති වන ලාභ හෝ පාඩු, විකිණීමෙන් ලැබෙන මුදල් හා දේපළ වල ඉදිරියට ගෙන එන අගය ලෙස තීරණය කරනු ලබන අතර එය ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

#### (ඈ) පසුකාලීන වියදම්

දේපළ, පිරියත හා උපකරණයක අයිතමයක කොටසක් ප්‍රතිස්ථාපනය. සංවර්ධනය, ඉදිකිරීමේ පිරිවැය, එම කොටස මගින් ආයෝජන මණ්ඩලයට අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අන්තර්ගතවීමේ ප්‍රවනතාවයක් ඇතිනම් සහ එහි පිරිවැය විශ්වාසනීයව මැනිය හැකිනම් අයිතමයේ ඉදිරියට ගෙනඑන අගයට හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ එදිනෙදා සේවාකිරීමේ පිරිවැය එම වියදම් දරන පරිදි ආදායම් හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

**(ඇ) *සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්***

මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනයට නිම නොකරන ලද කාර්යයන් සඳහා වසර තුල දරනු ලැබූ ප්‍රාග්ධන වියදම් සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් ලෙස දක්වනු ලැබේ. ඒවා යම් සමුච්චිත හානිකරන පාඩුවක් අඩුකර පිරිවැයට දක්වනු ඇත. සිදුකරමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් කළමනාකරණය අපේක්ෂාකරන පරිදි මෙහෙයුම් කිරීමට සුදුසු ස්ථානයේ හා තත්වයේ ඇතිවිට දේපළ, පිරියත හා උපකරණ, විලම්භීත වියදම් සහ මහා පරිමාණ ව්‍යාපෘති සඳහා දරනලද වියදම් යන අදාල වත්කම් කාණ්ඩයට මාරුකරනු ලැබේ.

**(ඉ) *කල්බදු වත්කම්***

මූල්‍ය වගකීම් යටතේ අත්පත් කර ගනු ලබන වත්කම් අදාල මූල්‍යමය වගකීම හඳුනා ගැනීමත් සමග කල්බදුගත් මෝටර් වාහන කාණ්ඩය යටතේ ප්‍රාග්ධනීකරණය හා ඇතුලත් කිරීම සිදුකෙරේ. මූල්‍ය කල්බදු යටතේ තබාගනු ලබන වත්කම් ඒවා භාවිතා කරන කාලසීමාව අනුව ක්ෂය කරනු ලැබේ.

***(ඊ) ව්‍යුහයන්***

ව්‍යුහයන්ගේ සාධාරණ අගය මූලික උප කාණ්ඩ හතක් යටතේ තක්සේරුකර තිබේ. එක් ප්‍රධාන උප කාණ්ඩයක් හා සම්බන්ධ සියලු අයිතම හා උපාංග එක් කොටසක ඒකකයක් සාදන ලෙස සලකනු ලැබේ.

**3.3 (අ) *ආයෝජන දේපළ***

ආයෝජන දේපළ එකී වත්කම් ආයෝජන දේපළ යටතේ වර්ගීකරණය කරනු ලබන දිනයට පවතින පිරිවැය අනුව දැක්වේ.

ආයෝජන දේපළ හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලා ඒමේ හැකියාවක් පවතින්නේනම් හා ආයෝජන දේපළ වල පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් ආයෝජන දේපළ හඳුනා ගනු ලැබේ. බදු කුලී ආදායම් ඉපයීමට ඇති දේපළ ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇත.

**(ආ) *ක්ෂය කිරීම (ක්‍රමක්ෂය)***

ඉඩම් හැර ආයෝජන දේපළ වල පිරිවැය/තක්සේරු කිරිම මත ක්ෂය කිරීම ඍජු රේඛා පදනම මත ගණනය කරනු ලැබේ. ආයෝජන දේපළ, ප්‍රයෝජනවත් ආයු කාලය මත පහත පරිදි වාර්ෂිකව ක්ෂයකර ඇත.

| වත්කම් කාණ්ඩය | වසරක් සඳහා ක්ෂය කිරීමේ ප්‍රතිශතය | කාල සීමාව (වසර) |
|---|---|---|
| ගොඩනැගිලි | 5 | 20 |

**3.4 *භාණ්ඩ වට්ටෝරු***

සියළු භාණ්ඩ වට්ටෝරු අඩු පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි කල හැකි අගයට ගණනය කරනු ලැබේ. පළමුව ලැබූ පළමුව පිට කල පදනම (FIFO) මත පිරිවැය තීරණය කෙරේ.

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

### 3.5 වෙනත් වත්කම්

වෙනත් වත්කම් වලට වෙනත් ණය ගැතියන්, ලැබිය යුතු දෑ, අත්තිකාරම්, තැන්පතු හා පූර්ව ගෙවීම් ඇතුලත් වේ.

*(අ) අත්තිකාරම්, තැන්පතු, පෙර ගෙවූ වියදම්*

එක් මූල්‍ය වර්ෂයකට වඩා වැඩියෙන් ප්‍රතිලාභ හෝ සම්බන්ධතාවයක් ඇති ලෙස සලකනු ලබන වියදම් අත්තිකාරම්, තැන්පතු හා පෙර ගෙවුම් වියදම් ලෙස වර්ගීකරණය කෙරේ. කාල සීමාව අවසානයේදී එකී වියදම් ඊට අදාල කරුණු අනුව කාල සමානුපාතික පදනම මත කපා හරිනු ලැබේ.

*(ආ) වෙනත් ණයකරුවන්*

වෙනත් ණයකරුවන් හානිපූරණ පාඩු අඩුකල පිරිවැයට හඳුනාගනු ලැබේ. ප්‍රධාන කාර්යාලයේ හිඟ මුදල් ලෙස වෙනත් ලැබිය යුතු දෑ යටතේ රු. 507,650.00 ක මුළු එකතුවක් පිළිබිඹු කෙරේ. මේ සම්බන්ධ නඩුව පිළිබඳව තවමත් කටයුතු කෙරෙමින් පවතී.

### 3.6 මුදල් හා මුදලට සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑ අත ඇති මුදල් හා දන්නා මුදල් ප්‍රමාණයකට පහසුවෙන් පරිවර්තනය කල හැකි හා අගය වෙනස්වීමේ නොසලකා හැරිය හැකි අවදානමකට ලක්වන කෙටිකාලීන ඉහල ද්‍රවශීල ආයෝජන වලින් සමන්විත වේ. මේවා කෙටිකාලීන මුදල් බැඳීම් ලබාගැනීමේ කාර්යය සඳහා රඳවා ගනු ලැබේ.

### 3.7 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රකාශන පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 7 (LKAS) අනුකූලව වක්‍ර ක්‍රමය යොදාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර ඇත.

### 3.8 සේවක ප්‍රතිලාභ

*(අ) නිර්වචිත දායකත්ව සැලසුම්*

ආයතනයේ ප්‍රඥප්ති හා නියෝග අනුව සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ (EPF) හා සේවක භාරකාර අරමුදලේ (ETF) දායකත්වය සඳහා සුදුසුකම් ලබයි. මණ්ඩලය විසින් සේවකයින්ගේ දළ වැටුපට අනුව, ස්ථාවර ප්‍රමාණයක දායකත්වයක් ලබා දෙන අතර වෙනත් ගෙවිය යුතු නෛතික හෝ ගිවිසුම්ගත නොවන වෙනත් බැඳීම් නොමැත.

*(ආ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්.*

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් යනු නිර්වචිත දායකත්ව සැලසුම් වලට අමතර පශ්චාත් සේවයකිරීමේ සැලසුම්වේ. මණ්ඩලය විසින් 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත අනුව පාරිතෝෂික ගෙවීම සඳහා බැඳී සිටී. පනත යටතේ ප්‍රතිපාදන සලසා ඇති පරිදි ආයුගණක ගනණය කිරීම පදනම් කරගෙන බැඳීම් තිරණය කෙරේ.

*ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය*

*මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)*

### 3.9 *වගකීම් හා ප්‍රතිපාදන*

පසුගිය සිද්ධියක් නිරාකරණය කිරීමේදී හා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත්වන සම්පත් පිටතට ගලායාමක ප්‍රතිඵලයක් ලෙස ඇතිවේයයි අපේක්ෂිත වත්මන් නෛතික/ගිවිසුම්ගත බැඳීම් ඇති විටෙක එය මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් බැඳීම් හා ප්‍රතිපාදන ලෙස හඳුනාගනු ලැබේ.

ණයදීමනාකරුගේ ඉල්ලිම අනුව හෝ මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනයට වසරක් තුල ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස සැලකේ. මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනට වසරකට පසුව ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් ලෙස සැලකේ.

***වෙනත් වගකීම්***

සමුච්චිත වියදම් ඇතුළු වෙනත් ණයකරුවන් වෙනත් වගකීම් වලට ඇතුලත් වේ. මේවා ඒවායේ  සාධාරණ අගය ලෙස සැලකෙන ඓතිහාසික අගයට දක්වනු ලැබේ.

### 3.10 *ආදායම හඳුනාගැනීම*

*(අ) <u>ආදායම</u>*

සේවා/ගාස්තු මගින් ලැබෙන ආදායම සලකා බලනු ලැබූ හෝ ලැබිය යුතු සාධාරණ අගයට මනිනු ලැබේ. බලපත්‍ර ගාස්තු හා ගිවිසුම් සැකසුම් ගාස්තු මුදල් පදනම මත හඳුනා ගැනේ.

*(ආ) <u>පොළී ආදායම</u>*

ලාභ හෝ පාඩු හරහා සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය මෙවලම් ඇතුළු පොළියක් සහිත සියලු මූල්‍ය මෙවලම් සඳහා වන පොළී ආදායම, ආදායම් ප්‍රකාශයේ "මූල්‍ය ආදායම" තුල හඳුනා ගනු ලැබේ.

*(ඇ) <u>වෙනත් ආදායම්</u>*

වෙනත් ආදායම උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 3.11 *වියදම්*

***වියදම් හඳුනා ගැනීම.***

*(අ) <u>ආදායම් වියදම</u>*

සියලු වියදම් සලකා බලන ලද සාධාරණ අගයට මනිනු ලබන අතර එම වියදම් අදාල වන කාලසීමාව අනුව හඳුනා ගැනේ.  සියළු දන්නා වගකීම් සඳහා හා දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීම සඳහා ප්‍රතිපාදන ලබාදීමෙන් පසු මණ්ඩලය උපයා ගනු ලබන අතිරික්තය ආදායම් ප්‍රකාශයේ දක්වනු ලැබේ.

***ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය***

***මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)***

*(ආ)* *ප්‍රාග්ධන වියදම්*

ආයතනය සඳහා හෝ ආයතනයේ සේවා/නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවීමේ අරමුණින් ස්ථිර ආකාරයෙන් වත්කම් පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරනු ලැබූ වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ අපහරණය මත ලැබූ ලාභ හෝ පාඩු, ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

*(ඇ)* මූල්‍ය ආදායම සහ මූල්‍ය වියදම්

ශුද්ධ මූල්‍ය ආදායම, ආදායම් හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලබන ආයෝජනය/තැන්පත් කර ඇති අරමුදල් මත පොළිය, කාර්යමණ්ඩල ණය සහ මූල්‍යමය බැදීම් මත පොළියෙන් සමන්විතවේ.

ණය ගැනීම්/මූල්‍ය කල්බදු හා සම්බන්ධ සියලු පොළි සහ දරනලද වෙනත් පිරිවැය, ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුවන ප්‍රමාණයට හැර ශුද්ධ මූල්‍ය ආදායමේ කොටසක් ලෙස වියදම් දරන පරිදි වියදම් කෙරේ.

**3.12** ***අදාල පාර්ශව ගනුදෙනු***

අදාල තොරතුරු ඊට අදාල මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල අනාවරණයකර ඇත.

**3.13** ***බදුකරණය.***

